# වාර්ෂික වාර්තාව

# 2016

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත
පරිසරයක් ගොඩනැගීම

# මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන්
නිදහස් බව තහවුරු කිරීම



## 2016 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| **ආචාර්ය නටාෂා බාලේන්ද්‍ර මහත්මිය** | සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,අංක 330, තලවතුගොඩ පාර,<br>මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර |
| **නීතිඥ සජීව සමරනායක මහතා** | නියෝජ්‍ය සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,අංක 330, තලවතුගොඩ පාර,<br>මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර |
| **වෛද්‍ය එස්. පී. කඳපොල ආරච්චිගේ මහතා** | මනෝ වෛද්‍ය විශේෂඥ,<br>මූලික රෝහල, ගම්පහ |
| **වෛද්‍ය ලිලන්ති ඩී. සිල්වා මහත්මිය** | ළමා රෝග විශේෂඥ,<br>දකුණු කොළඹ ශික්ෂණ රෝහල,ගම්පහ |
| **වෛද්‍ය යූ.ඒ.කේ. තෙන්නකෝන් මහතා** | අධිකරණ වෛද්‍ය නිලධාරි,<br>විෂ වේදය හා නීති වෛද්‍ය ආයතනය, අංක 111, ෆ්‍රැන්සිස් පාර,<br>කොළඹ 10 |
| **ආචාර්ය ටී. ස්වින්ද්‍රන් මහතා** | මනෝ විද්‍යාඥ,<br>ලෝක සෞඛ්‍ය සංවිධානය, කොළඹ 07 |
| **කේ. වෛද්‍යරත්න මහතා** | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්<br>නීතිපති දෙපාර්තමේන්තුව,<br>කොළඹ 12 |
| **එම්. ආර්. ලතීෆ් මහතා** | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය,පොලිස් මූලස්ථානය,<br>කොළඹ 01 |
| **චන්දිමා සිගේරා මහත්මිය** | කොමසාරිස්,<br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,II වන අදියර,<br>සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| **චාන්දනී අමරතුංග මහත්මිය** | කම්කරු කොමසාරිස් ජෙනරාල්,<br>කම්කරු දෙපාර්තමේන්තුව,කොළඹ 05 |
| **ඩී. එස්. විජේසේකර මහත්මිය** | අතිරේක ලේකම්,<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,<br>II වන අදියර, සෙත්සිරිපාය,බත්තරමුල්ල |
| **ආර්.එම්.ඒ. රත්නායක මහතා** | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය,<br>කොළඹ 01 |
| **සිරිවර්ධන දහනායක මහතා** | සමාජික,<br>අංක 3280,අදියර III,<br>අනුරාධපුරය |
| **එම්.ඩබ්ලිව්. ජයවර්ධන මහතා** | සමාජික,<br>අංක.2795,ඩී.එස්. සේනානායක මාවත, අදියර III<br>අනුරාධපුරය |
| **ආර්.බී. අබේසිංහ මහතා** | සමාජික,<br>අංක 621/4, ගොඩගේ මාවත<br>අනුරාධපුරය |

## 2016 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

| | |
|---|---|
| **පියුමන්ති පීරිස් මහත්මිය** | අතිරේක ලේකම්<br>අධිකරණ අමාත්‍යාංශය,<br>ඉහළ උසාවි සංකීර්ණය,<br>කොළඹ 12 |
| **එච්.යූ. ප්‍රේමතිලක මහතා** | අතිරේක ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල |
| **එස්. සී. විතාන මහතා** | අතිරේක ලේකම්,<br>රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය,<br>බාලදක්ෂ මාවත,<br>කොළඹ 03 |
| **ඒ. එම්.කේ.කේ. අත්තනායක මහත්මිය** | අතිරේක ලේකම්,<br>සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,<br>අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,<br>කොළඹ 10 |
| **පී.ජේ.ඩී. ප්‍රනාන්දු මහත්මිය** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය,<br>සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල |
| **යූ. එස්. දෙනාවත්ත මහත්මිය** | අතිරේක ලේකම්,<br>පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශය, ,<br>අංක 330, යුනියන් පෙදෙස,<br>කොළඹ 02 |
| **පී. මහදේව මහතා** | කොමසාරිස්,<br>කාන්තා හා ළමා කටයුතු අංශය,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>කොළඹ 05 |
| **හේමා පෙරේරා මහත්මිය** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය,<br>අංක 163, කිරුලපන මාවත,<br>පොල්හේන්ගොඩ, කොළඹ 05 |

| පටුන | පිටුව |
|---|---|
| හැඳින්වීම | 01 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සැකවින් | 02 |
| අධිකාරියේ ව්‍යුහය | 03 |
| 2016 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය | 03 |
| 2016 ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය | 04 |
| **ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්** | **05 -26** |
| ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය | 05 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා ළමා ආරක්ෂාව විෂයගත කිරීම | 05 |
| දෙවන ශ්‍රේණියේ පාසල් විෂය මාලාව සඳහා ජීවන නිපුණතා හඳුන්වා දීම | 05 |
| ළමා අපයෝජනය හා නොසළකා හැරීම පිළිබඳ සිද්ධි කළමනාකරණය සඳහා ජාතික මාර්ගෝපදේශ සංග්‍රහයට සහාය ලබා දීම | 05 |
| අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙළ කිරීම | 06 |
| ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කිරීම | 06 |
| ශ්‍රී ලංකාවේ පාසල් තුළ භාවිතා වන ළමුන් හික්මවා ගැනීමේ ක්‍රම පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම | 06 |
| ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශයක් පිළියෙල කිරීම | 06 |
| ළමා සුරැකුම් පාඨමාලාව (Child Care NVQ 4) | 06 |
| වෙරළබඩ කලාපය ආශ්‍රිත ළමා ආරක්ෂක නියමු ව්‍යාපෘතිය | 07 |
| අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා එම පද්ධතිය වඩාත් ළමා හිතකාමී ලෙස හැසිරවීම | 07 |
| සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන වින්දිත වූ ළමුන් සඳහා පුනරුත්ථාපන කටයුතු හා සුබසාධන කටයුතු සිදු කිරීම | 07 |
| හදිසි ආපදා තත්ත්වයන්හිදී කටයුතු කිරීම | 07 - 08 |
| ළමා රැකවරණ සේවා සපයන හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීමේ වැඩසටහන | 08 |
| ළමා හිතකාමී පාසල් පරිසර නිර්මාණය කිරීම | 08 - 09 |
| ග්‍රාමීය මට්ටමින් ළමුන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ප්‍රජා වැඩසටහන් ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ හා ප්‍රජාවගේ ධාරිතා වර්ධනය කිරීමේ දීපව්‍යාප්ත වැඩසටහන | 09 |
| පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 09 |
| සෞඛ්‍ය වෘත්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන | 10 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 10 |
| ළමා හිංසනයට එරෙහි ජාතික දිනය සැමරීම | 11 |
| ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය සැමරීමේ ජාතික උත්සවය | 11 |
| ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය | 12 |
| තොරතුරු ලබා දීම | 13 |
| ළමා ආරක්ෂාවට අදාළ තොරතුරු ජනමාධ්‍ය හරහා ජනතාව අතරට රැගෙන යාම | 13 |
| ළමා ආරක්ෂාව පිළිබඳව ළමුන් හා වැඩිහිටියන් දැනුවත් කිරීම සඳහා අන්තර් පාඨශාලයීය විවාද තරඟාවලිය | 13 |
| ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ දිස්ත්‍රික් තරඟ පැවැත්වූ ආකාරය | 14 |
| තරඟාවලියේ සිංහල මාධ්‍ය අවසන් 32 තරඟ සහ දෙමළ මාධ්‍ය අවසන් 32 තරඟ පැවැත්වීම | 14 |
| ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ සිංහල, මාධ්‍ය වැඩමුළුව | 14 |
| ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ දෙමළ මාධ්‍ය වැඩමුළුව | 15 |
| ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ රූපවාහිනී පටිගත කිරීම් හා විකාශය කිරීම | 15 - 17 |
| අන්තර් පාඨශාලයීය විවාද තරඟාවලියේ විශේෂ අවස්ථා | 17 |
| ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ අවසන් මහා තරඟය | 17 - 18 |
| ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ ත්‍යාග සහ සහතික පත්‍ර | 18 |
| ළමා ආරක්ෂාව පිළිබඳව කෙටි චිත්‍රපට තරඟාවලියක් | 18 |

ළමා ආරක්ෂාව විෂය පිළිබඳව පාසල් මාධ්‍ය ඒකක සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහනක් 19
ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම ………………………………………………............ 19
ළබැඳි පුවත් හසුන ……………………………………………………………............… 19
මාධ්‍ය ප්‍රචාරණ දැන්වීම් ………………………………………………………...........… 20
ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය සංවර්ධනය කිරීම ………….........… 20
ළමා ආරක්ෂාව පිළිබඳ නිර්මාණය කෙරෙන නව වෙබ් අඩවිය …………………............ 20
ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය භාෂා ත්‍රිත්වයට හැරවීම …….......... 21
ළමා ආරක්ෂාව පිළිබඳව අත්පත්‍රිකා හා පෝස්ටර් ඇතුළු මුද්‍රිත මෙවලම් නිර්මාණය.......... 21
1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව …………………………………………….......... 21 - 22
ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ………………………………………………........... 22 - 23
නීතිමය කර්තව්‍යන් ……………………………………………………………............. 23 - 24
ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම ……………………............. 24
අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය ක්‍රියාත්මක කිරීම …………………………….......... 24 - 25
විශේෂ පොලිස් විමර්ශන ………………………………………………………........... 25
අන්තර්ජාලය සහ වෙනත් ජංගම දුරකථන අනිසි ලෙස පරිහරණය කිරීම හරහා ළමයින්ට
ලිංගික වශයෙන් සහ වෙනත් ආකාරවලින් හිංසා කිරීම පිළිබඳ පැමිණිලි කිරීමට
077-3220032 හා 071-3220046 නමින් වෙනම ම දුරකථන අංක දෙකක් …..................... 25
මනෝසමාජීය ක්‍රියාකාරකම්………………………………………………….........…. 26
හදිසි ආපදා අවස්ථාවලදී ළමුන් සඳහා මනෝසමාජීය සහයන් ලබාදීම ……….........…. 26
ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන ……………………………………………………..........…. 26
වර්ෂය අවසන් ආදායම් ප්‍රකාශය ……………………………………….................… 27
2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය ………………..................….. 27
2016.12.31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශය ……………………………………...............… 28
2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ……………….................… 29
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ………... 30
විගණන වාර්තා ……………………………………………………………….................. 31 - 46

# හැඳින්වීම

ළමා අපයෝජනය යන්න සංකීර්ණ සමාජ ප්‍රශ්නයක් බවට අන්තර් ජාතික වශයෙන් පත්ව ඇත. පරිගණක හා අන්තර්ජාල භාවිතය වැඩිවීමත් සමග ළමා අපයෝජනය සිදු කිරීමට එම මාධ්‍ය භාවිතා කිරීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබේ. මෙහිදී ශ්‍රී ලංකාව තුළ පවතින නීතිමය පසුබිම ප්‍රමාණවත් නොවේ. ඒ සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මේ වසරේදී වැඩි අවධානයක් යොමු කර තිබේ.

1989 නොවැම්බර් 20 වන දින "එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය" විශ්ව ප්‍රකාශනයක් ලෙස සම්මත කර ගන්නා ලදි. මෙම ප්‍රඥප්තිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමගින් ලොව සෑම ළමයෙකුටම හිමි විය යුතු අයිතිවාසිකම් මෙන් ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවතින සමාජ තත්ත්වය විමර්ශනය කිරීමේ දී, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය, ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම අරමුණු කරගත්, ජාත්‍යන්තර ළමා රහස් වෙළඳාම ඉහළ යාම දැඩි ලෙස සැළකිලිමත් වෙමින් ද, ආයුධ සන්නද්ධ අරගලයන් හි දී ළමයින් බලහත්කාරයෙන් යුධ සේවාවෙහි යෙදවීම හෝ බඳවා ගැනීම අන්තර් ජාතික අපරාධයක් ලෙස දක්වමින් ද වර්ෂ 2000 දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ට, ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම යන අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදී

ලොව පැවති මෙම ප්‍රවනතාවයත් සමඟ ලංකා රජය ද එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සඳහා 1991 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදි. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහි දී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරී බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිට ම වර්තමානය දක්වා ම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන් හි දී ඊට අදාල නිසි පියවර ගැනීම හා වින්දිත ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ බලතල භාවිතා කරමින් දැයේ ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිත භාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත මගින්ද අධිකාරිය වෙත බලතල හිමි ව පවතියි. තවද 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩක්‍රියා වැළැක්වීමේ පනත මගින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ විට අධිකාරියට වාර්තා වීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් විය හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනම්ව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරී පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදි. මෙම දුරකථන සේවය ආරම්භයත් සමග සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන වාර්තා වීම දක්නට ලැබුණි. අද වන විට ලංකාවේ සියලු ම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන වාර්තා වන අතර, උපදේශන සේවාවන් ද මෙමගින් ලබාගත හැකිය. වර්තමානය වන විට මෙම දුරකථන සේවය ජනතාවට වඩාත් සමීප වෙමින් ක්‍රියාත්මක වේ.

# ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සැකවින්


- ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජන වලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- එවැනි අපයෝජන වලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- අපයෝජන වලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජන වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථා වල දි එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා හා ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.
- සියලු ආකාර ළමා අපයෝජනවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.
- ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
- සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැළකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමු වීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුලුකර ගැනීම.
- අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.
- ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදි ඒ පැමිණිලි නිසි බලධාරින් වෙත යොමු කිරීම.
- ළමා අපයෝජනවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත්සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහය වීම.
- ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වා ගෙන යාම.
- අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුන්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.
- ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ළමයින්ගේ සුරක්ෂිත භාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබා දීම.
- ළමා අපයෝජන වලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයෙහි යෙදීම.
- ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.
- සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

## අධිකාරියේ ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පහත ඒකක ක්‍රියාත්මක වේ.

- පරිපාලන හා මානව සම්පත් අංශය
- මූල්‍ය අංශය
- සැලසුම් හා නියාමන අංශය
- තොරතුරු හා මාධ්‍ය අංශය
  - -පුස්තකාලය
- වැඩසටහන් අංශය
- මනෝසමාජීය අංශය
- නීති අංශය
- නීතිය බලාත්මක කිරීමේ අංශය
  - - 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
  - - විමර්ශන ඒකකය
  - - මධ්‍යම ලේඛනාගාරය
- අභ්‍යන්තර විගණන අංශය
- විශේෂ පොලිස් විමර්ශන අංශය

2016 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය.



## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය - 2016

| අංකය | තනතුර | වැටුප්- කේත අංකය | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සාමාන්‍යාධිකාරි | HM -2-1 | 01 |
| 02 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි | HM -1-3 | 01 |
| 03 | කළමණාකරු - පරිපාලන හා මානව සම්පත් | HM -1-1 | 01 |
| 04 | කළමණාකරු - මූල්‍ය | HM -1-1 | 01 |
| 05 | කළමණාකරු - නීති | HM -1-1 | 01 |
| 06 | සායනික මනෝවිද්‍යාඥ | HM -1-1 | 01 |
| 07 | කළමණාකරු - සැලසුම් හා තොරතුරු | HM -1-1 | 01 |
| 08 | කළමණාකරු - වැඩසටහන් | HM -1-1 | 01 |
| 09 | කළමණාකරු - නීතිය බලාක්මක කිරීම | HM -1-1 | 01 |
| 10 | සහකාර කළමණාකරු - පරිපාලන | MM -1-1 | 01 |
| 11 | සහකාර කළමණාකරු - නීති | MM -1-1 | 01 |
| 12 | සහකාර කළමණාකරු - වැඩසටහන් | MM -1-1 | 01 |
| 13 | සහකාර කළමණාකරු - මනෝවිද්‍යා | MM -1-1 | 01 |
| 14 | සහකාර කළමණාකරු - සැලසුම් හා නියාමන | MM -1-1 | 01 |
| 15 | සහකාර කළමණාකරු - තොරතුරු හා මාධ්‍ය | MM -1-1 | 01 |
| 16 | සහකාර කළමණාකරු - නීතිය බලාත්මක කිරීම | MM -1-1 | 01 |
| 17 | ගණකාධිකාරී | MM -1-1 | 01 |
| 18 | අභ්‍යන්තර විගණක | MM -1-1 | 01 |
| 19 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | JM – 1-1 | 01 |
| 20 | පරිපාලන නිලධාරි | JM – 1-1 | 01 |
| 21 | වැඩසටහන් නිලධාරි | JM – 1-1 | 01 |
| 22 | ගිණුම් නිලධාරි | JM – 1-1 | 01 |
| 23 | විමර්ශන නිලධාරි | JM – 1-1 | 01 |
| 24 | තොරතුරු හා මාධ්‍ය නිලධාරි | JM – 1-1 | 01 |
| 25 | සැලසුම් හා නියාමන නිලධාරි | JM – 1-1 | 01 |
| 26 | පර්යේෂණ හා සුභසාධන නිලධාරි | JM – 1-1 | 01 |
| 27 | පරිවර්තක (ඉංග්‍රීසි) | MA - 4 | 01 |
| 28 | පරිවර්තක (දමිළ) | MA - 4 | 01 |
| 29 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 25 |
| 30 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි | MA - 3 | 25 |
| 31 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 360 |
| 32 | පරිපාලන සහකාර | MA - 3 | 01 |
| 33 | ගිණුම් සහකාර | MA - 3 | 03 |
| 34 | මාධ්‍ය සහකාර | MA - 3 | 03 |
| 35 | පුස්තකාලයාධිපති | MA - 3 | 01 |
| 36 | සැලසුම් සහකාර | MA - 3 | 01 |
| 37 | නීති සහකාර | MA - 3 | 03 |
| 38 | විමර්ශන සහකාර | MA - 3 | 02 |
| 39 | උපදේශන සහකාර | MA - 3 | 04 |
| 40 | වැඩසටහන් සහකාර | MA - 3 | 03 |
| 41 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර | MA - 3 | 01 |
| 42 | අන්තර්ජාල ආවේක්ෂණ සහකාර | MA - 3 | 01 |
| 43 | චිකිත්සක | MA - 3 | 03 |
| 44 | වීඩියෝ තාක්ෂණ සහකාර | MA – 2-1 | 01 |
| 45 | කළමණාකරන සහකාර (තාක්ෂණික) | MA – 2-1 | 15 |
| 46 | තොරතුරු තාක්ෂණ සහකාර | MA – 2-1 | 02 |
| 47 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) | MA – 1-1 | 32 |
| 48 | රියදුරු | PL-3 | 07 |
| 49 | පණිවුඩකරු | PL-1 | 01 |
| 50 | කාර්යාල කාර්ය සහයක | PL-1 | 03 |
| 51 | කාර්යාල කම්කරු | PL-1 | 02 |
| | **මුළු සංඛ්‍යාව** | | 527 |

# ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්

## ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ මූලික කාර්යභාරයක් වන ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් පිළියෙළ කිරීම සඳහා අධිකාරිය කටයුතු කරනු ලබයි. ඒ අනුව ළමා ආරක්ෂාවට අදාළ ජාතික ප්‍රතිපත්තිය සැකසීමට අදාළව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිනිය ඇතුළු අධ්‍යක්‍ෂ මණ්ඩල, මූල මණ්ඩල සාමාජිකයින්ගෙන් අදහස් ලබා ගන්නා ලදි. එමෙන්ම ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සිටින ක්ෂෙත්‍රයේ විශේෂඥයින් හා ළමුන් සමඟ සමීපව කටයුතු කරනු ලබන අධ්‍යාපන, සෞඛ්‍ය, අධිකරණ, කම්කරු හා නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ මට්ටමින් අදහස් විමසීම 2016 වර්ෂයේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීති අංශය විසින් සිදුකරන ලදි. ළමා ආරක්ෂාව සම්බන්ධ අධිකරණ කටයුතුවලදී අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය හා ඊට අදාළ ව්‍යතිරේඛයන් පිළිබඳව පොලිසිය, ළමා හා කාන්තා කාර්යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශ නිලධාරීන්ගේ අදහස් ගොණුකරනු ලැබුණි. ළමා ආරක්ෂණය හා ළමයින් ආයතන ගතකිරීම සම්බන්ධයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වෘත්තිකයින්ගේ අදහස් ගොනුකරමින් ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය සැකසීමේ මූලික පදනම නීති අංශය විසින් 2016 වර්ෂයේ දී සිදුකර ඇත.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා ළමා ආරක්ෂාව විෂයගත කිරීම

ළමයා ප්‍රමුඛ කර ගත් ක්‍රියාකලාපයක් රට තුළ ඇතිකිරීම අරමුණු කර ගනිමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ළමයා කේන්ද්‍ර කරගත් න්‍යාය පත්‍රයක ඇති අවශ්‍යතාව පිළිබඳ ජාතික වැඩපිළිවෙළක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක කරයි. මේ සම්බන්ධව යෝජනා කිහිපයක් ආණ්ඩුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති අතර, "ළමයාගේ උපරිම යහපත" පිළිබඳව සෑම අවස්ථාවකදීම අවධානය යොමුකර ඒ සඳහා සියලු පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණය බලාත්මක කිරීම මෙහිදී අපේක්ෂා කරයි. මෙමගින් ළමයින්ගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, ළමයින්ගේ උපරිම යහපත මෙන්ම ඔවුන්ට ශක්තිමත් පෞරුෂයක් උරුම කර දීම උදෙසා බලපාන්නා වූ සෘජු ප්‍රතිපත්තීන් කිහිපයක් සමාජගත කිරීම මෙමගින් අප විසින් අරමුණු කරනු ලැබේ.

## දෙවන ශ්‍රේණියේ පාසල් විෂය මාලාව සඳහා ජීවන නිපුණතා හඳුන්වා දීම

අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය හා අධිකාරිය එක්ව ළමයාගේ ප්‍රාථමික අධ්‍යාපනයේ සිටම ජීවන නිපුණතා හඳුන්වාදීම සඳහා කටයුතු කරයි. මෙහි අරමුණ වනුයේ ළමයා තුළ භාවමය බුද්ධිය ගොඩනැගීම හා ආත්ම විශ්වාසය ඇති කරලීමය. තීරණ ගැනීම, ප්‍රශ්න විසඳීම, නිර්මාණාත්මක චින්තනය, විචාරාත්මක චින්තනය, අන්තර්පුද්ගල සබඳතා, ස්වයං අවබෝධය, සානුකම්පිත බව, හැඟීම් කළමනාකරණය සහ ආතති කළමනාකරණය යන විෂයධාරාවන් ඔස්සේ ළමුන් ඉගෙනුම ලබයි. මේ සඳහා අවශ්‍ය ගුරු පුහුණු පාඨමාලා සකස් කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය සමග ක්‍රියා කරයි. 2016 වසරේදී මෙය අවසන් කරන ලදි. මේ සම්බන්ධයෙන් 2016 වසර තුළ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 5 ක් සිදු කර ඇත. දැනුවත් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 372කි. මෙයට අමතරව දෙවන සහ තෙවන ශ්‍රේණිය විෂය නිර්දේශයට අදාළව ළමා ආරක්ෂාව සහ පෞරුෂය සංවර්ධනය සම්බන්ධයෙන් අදාළ ගුරු උපදේශකවරුන් පුහුණු කිරීම සඳහා වීඩියෝ පට 03 ක් නිර්මාණය කිරීමේ මූලික කටයුතු ආරම්භකර ඇත.

## ළමා අපයෝජනය හා නොසළකා හැරීම පිළිබඳ සිද්ධි කළමනාකරණය සඳහා ජාතික මාර්ගෝපදේශ සංග්‍රහයට සහාය

ළමා අපයෝජනය හා නොසළකාහැරීම සම්බන්ධ සිද්ධි කළමණාකරණයේ දී සාකල්‍ය ප්‍රවේශයක් සඳහා අවශ්‍යවන්නා වූ ළමා වෛද්‍ය විශේෂඥයින් විසින් සකසන ලද මාර්ගෝපදේශයන් දීප ව්‍යාප්තව බලාත්මක කිරීමේ අරමුණින් යුතුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් සෞඛ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් පාර්ශ්වයන් හා එකමුතුව ඉදිරිපත් කිරීමට අධිකාරිය සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි. එහි මූලික පදනම මෙම වසරේදී සිදු කරන ලදි.

## අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙළ කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කරනු ලැබේ. ළමයින් විධිමත් පාසල් පද්ධතියෙන් ගිලිහීයාමේ අවධානමට ලක්වීම සඳහා බලපාන හේතු මගහරවා ඔවුන් පාසල් පද්ධතිය තුළ සක්‍රීයව රඳවා ගැනීම සඳහා කළ හැකි ක්‍රියාදාමයන් පිළිබඳව අධ්‍යාපන ක්‍ෂේත්‍රයේ අධ්‍යාපන පරිපාලකයින් සමග සාකච්ඡා කර සුදුසු වැඩසටහනක් සැකසීමේ අවශ්‍යතාව මෙහිදී අවධාරණය කිරීම අප විසින් අපේක්ෂා කරයි. එවන් ළමුන් හඳුනාගැනීමේ නිර්ණායකයන්, පාසල් අධ්‍යාපනයෙන් ගිලිහීමේ අවධානමට ලක්වන ළමුන් හඳුනාගත්විට ඒ සඳහා පිළියම් යෙදීමේ වගකීම පැවරෙන නිලධාරීන් හා ඔවුන්ගේ කාර්යභාරයන් විනිශ්චය කිරීම යනාදී කාර්යයන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් මාර්ගෝපදේශන සංග්‍රහයක් සකස් කිරීමට අපේක්ෂිත වන අතර ඒ සඳහා මූලික පදනම ඇති කිරීම මෙම වසරේ දී සිදුකරන ලදි.

## ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් 2016 වර්ෂයේදී ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම් සඳහා මාර්ගෝපදේශයක් නිර්මාණය කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදි. ප්‍රධාන වශයෙන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල සේවයෙහි නියුක්ත ළමා ආරක්ෂාව පිළිබඳව මෙන්ම ප්‍රජා සංවර්ධනය ඉලක්කකර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන නිලධාරීන් උදෙසා ඒකාබද්ධ ප්‍රවේශයක් අරමුණු කර ගනිමින් මෙම මාර්ගෝපදේශය නිර්මාණය කිරීමට සැලසුම් කර ඇත. මෙහි මූලික පියවරක් වශයෙන් දිස්ත්‍රික් 16 කදී ළමුන්ගේ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය හා රජ්‍ය නොවන නිලධාරීන් සමග සම්මුඛ සාකච්ජා පවත්වන ලදි. මේ සඳහා ළමුන් ද සහභාගි කරගෙන ඇත. ඒ අනුව 2016 වර්ෂයේ දී වෘත්තිකයන් 155 දෙදෙනෙක්, සිවිල් සංවිධාන සාමාජිකයන් 236 දෙනෙක් සහ ළමුන් 28 දෙනෙක්ගෙන් අදහස් ලබාගෙන ඇත.

## ශ්‍රී ලංකාවේ පාසල් තුළ භාවිතා වන ළමුන් හික්මවා ගැනීමේ ක්‍රම පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ පාසල් තුළ භාවිතා වන ළමුන් හික්මවා ගැනීමේ ක්‍රම පිළිබඳ පර්යේෂණ අධ්‍යනයක් සිදු කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වනවිට අවසන් කර ඇත. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා අධිකාරිය එකතුව පාසල් තුළ පවතින විනය ක්‍රියාකාරකම් සහ ඒවායේ සඵලතාව කොතරම්ද යන වග අධ්‍යයනය සඳහා පර්යේෂණයක් සිදු කරයි. විනය පිණිස දැඩි දණ්ඩනයන්ට වඩා ධනාත්මක ලෙස විනය හැසිරවීම පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයන් හා අධ්‍යාපනවේදීන් දැනුවත් කිරීමට එයින් හැකිවනු ඇත.

## ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශයක් පිළියෙල කිරීම

ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ අමාත්‍යාංශය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ළමා ලේකම් කාර්යාලය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමග ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පෙරමග ගනිමින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රමිතිගත කිරීම හා සුරක්ෂිත ළමා හිතකාමී පරිසර ගොඩනැගීම සඳහා ජාතික මාර්ගෝපදේශයක් පිළියෙල කිරීමට කටයුතු කරයි. කෙටුම්පත සකස් කර 2016 වසරේදී අවසන් කර ඇත.

## ළමා සුරැකුම් පාඨමාලාව (Child Care NVQ 4)

2016 වසරේදී රුපියල් මිලියන 50 ක මුදලක් ළමා රැකවරණ සපයන්නන්ගේ රාජකාරි ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ අනුව ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට අදාළ ජාතික මාගෝපදේශයට සමගාමීව ළමා සුරැකුම් සහතිකපත්‍ර පාඨමාලාව (NVQ 4) සකස් කර එය හඳුන්වාදීම සිදු කරන ලදි. ඒ අනුව වෘත්තිය පුහුණු අධිකාරිය (VTA) දිස්ත්‍රික් 5 ක් තුළ (කොළඹ, කළුතර, මහනුවර, ගාල්ල සහ කිලිනොච්චි) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි මෙම පාඨමාලාව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. මෙම පාඨමාලාව පැවැත්වීම සඳහා වෘත්තිය පුහුණු අධිකාරිය වෙත බඳවාගනු ලැබූ නව උපදේශකවරුන් සඳහා පුහුණු (TOT) පවත්වන ලදි. මෙම පාඨමාලාව මොඩියුල් 12 කින් සමන්විත වන අතර ඒ සඳහා පුහුණු අත්පොතක් ද සකසා ඇත.

## වෙරළබඩ කලාපය ආශ්‍රිත ළමා ආරක්ෂක නියමු ව්‍යාපෘතිය

ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතට අනුව ළමා අපයෝජන වලට ඇති ඉඩ ප්‍රස්ථාව අවම කිරීම පිණිස සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයෙහි යෙදීමට පැවරී ඇති බැවින් 2016 වසරේ හික්කඩුව ප්‍රදේශයේ නාරිගම වැල්ලබඩ වසම තුළ වෙරළබඩ කලාපය ආශ්‍රිත ළමා ආරක්ෂාව පිළිබඳ විශේෂ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.

## අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා එම පද්ධතිය වඩාත් ළමා හිතකාමී ලෙස හැසිරවීම

ළමා අපයෝජන සිද්ධි සම්බන්ධව සිදුවන්නා වූ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය වඩාත් ළමා හිතකාමී මුහුණුවරක් ගැනීම පිණිස අවශ්‍ය පසුබිම සකස් කිරීම සඳහා අධිකාරිය කටයුතු කරනු ලබයි. එමෙන්ම අධිකරණ ක්‍රියාවලිය වඩාත් ඵලදායිවීම උදෙසා ගොනු වී ඇති නඩු විභාගයට ගෙන, හැකි ඉක්මනින් විනිශ්චය අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් හා සම්පත් සම්බන්ධව පොලීසිය හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීම මෙහිදී අප විසින් අපේක්ෂා කරනු ලැබේ.

එමෙන්ම, ගැහැණු ළමයා වයස අවුරුදු 14 ක් හෝ වැඩිමහල් සහ පිරිමි ළමයා වයස අවුරුදු 18 ට අඩු වූ අවස්ථාවක ස්ත්‍රී දූෂණයට එරෙහිව පවරන්නා වූ නඩු කටයුතුවල දී පිරිමි ළමයා විසින් වරද පිළිගනියි නම් මහේස්ත්‍රාත්වරයා හට අත්හිටවූ සිර දඬුවමක් ලබාදීමට හැකිවන සේ නීති සංශෝධන කෙටුම්පතක් අධිකාරිය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම කරනු ලැබේ.

සෑම පොලිස් ස්ථානයකම පවතින ළමා හා කාන්තා කාර්යාංශයට අයත් කටයුතු වඩාත් ඵලදායී හා ළමා හිතකාමී පරිසරයක් ඇති කිරීම අරමුණු කර ගනිමින් ඒ සඳහා විශේෂයෙන් පුහුණුවලත් කාර්යය මණ්ඩලයක් පත්කර ගැනීමටත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තම සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවයි.

## සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන වින්දිත වූ ළමුන් සඳහා පුනරුත්ථාපන කටයුතු හා සුබසාධන කටයුතු සිදු කිරීම

සුනාමි විපතෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙමාපියන් අහිමි වූ වයස අවුරුදු 21 ට අඩු සෑම ළමයෙකුම හා යෞවනයෙකු සම්බන්ධ සුබසාධනය පිළිබඳව මෙහිදී සළකා බලයි. දෙමාපිය දෙදෙනාගෙන් එක් අයෙකු අහිමිව හා ජීවත්ව සිටින මවට හෝ පියාට රැක ගැනීමට හා ආරක්ෂාව සැපයීමට හැකියාවක් නොමැති සෑම ළමයෙකුම හා යෞවනයෙකුටම 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත මගින් රැකවරණය සලසයි.  වින්දිත වූ ළමුන් උදෙසා කැපකරු මාපිය රැකවරණ කටයුතු, පසුවිපරම් කටයුතු හා සුභසාධන කටයුතු සිදු කෙරේ.

2016 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා සෑම මසකටම රු. 5000 බැගින් සුනාමි කැපකරු මාපිය රැකවරණය ලබන ළමුන් 118 දෙනෙකු සඳහා අධ්‍යාපන ආධාර ලබාදීමට කටයුතු කර ඇත. මේ අනුව, 2016 වර්ෂය සඳහා ළමුන් 118 දෙනෙකු වෙනුවෙන් අධිකාරිය විසින්  රු.6,205,000.00 ක මුදල් ප්‍රමාණයක් අධ්‍යාපන ආධාර වශයෙන් ලබා දී ඇත.

2016 වර්ෂයේ සුනාමි වින්දිත ළමුන් විසින් යොමු කරන ලද විවිධ අවශ්‍යතාවයන්ට අදාළ ඉල්ලීම් වන මහන මැෂින් ලබා දීම, උසස් අධ්‍යාපන පාඨමාලා සඳහා පාඨමාලා ගාස්තු ලබා දීම, රැකියා සඳහා යොමු කිරීම ද සිදු කරන ලදි.

## හදිසි ආපදා තත්ත්වයන්හි දී කටයුතු කිරීම

ජල ගැලීම්, සුළිසුලං, නායයෑම්, භූමිකම්පා හා සුනාමි අවස්ථා හේතුවෙන් ඕනෑම වේලාවකදී ආපදා තත්ත්වයක් ඇති විය හැකියි. එවැනි ආපදා තත්ත්වයකදී ළමයින් දැඩි අපහසුතාවයන්ට ලක් වේ. එබැවින් ආපදා තත්ත්වයකදී ළමයින් රැකබලා ගැනීම විශේෂ අවධානයකින් සිදු කළ යුතුය. මෙහිදී කඳවුරු තුළදී ළමුන්ගේ මානසික සෞඛ්‍ය නගා සිටුවීම සහ ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කළ යුතුය. මෙවැනි අවස්ථාවලදී ළමයින්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතුයි.

මෙම වසරේදී අරණායක ඇතිවූ නායයාම් හදිසි තත්ත්වය සහ කොළඹ අවට ඇතිවූ හදිසි ගංවතුර උවදුර හේතුවෙන් අවතැන් වූ ළමුන්ට සහ කඳවුරුවාසීන්ට සුභසාධන කටයුතු සිදු කරන ලදි. විශේෂයෙන්ම ජාතික

ළමා ආරක්ෂක  අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරීන්,  ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සහ මනෝසමාජීය  අංශයේ නිලධාරීන් මේ සඳහා සහභාගි විය.මෙම කඳවුරු තුළ සිටින ළමුන්ට අවශ්‍ය උපදෙස් , මනෝසමාජීය මැදිහත්කරණයන් සහ අපයෝජනයෙන් ළමුන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය දැනුවත්වීම් කටයුතු සිදු කරන ලදි. මෙම කඳවුරු පැවති වකවානුව තුළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමියගේ සහ නියෝජ්‍ය සභාපතිතුමාගේ මූලිකත්වයෙන් සේවක සුභසාධක සංගමයෙන් අධිකාරියේ නිලධාරීන් මෙම කඳවුරුවලට අවශ්‍ය අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.

## ළමා රැකවරණ සේවා සපයන හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීමේ  වැඩසටහන

රටේ ළමුන්ගේ සුරක්ෂිත බව ඇති කිරීම සඳහා පිහිටුවා ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වර්තමානය වන විට විවිධ ක්‍රියාමාර්ග ඔස්සේ යමින් එම අරමුණ ඉටුකරමින් සිටී. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ (14) ග වගන්තියට අනුව ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පවරා ඇත.

මේ අනුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා නිවාසයන්හි ජීවත්වන ළමුන්ගේ උපරිම යහපත සලසනු වස් ළමා නිවාස අධීක්ෂණය සිදු කරන ලදි. 2016 වර්ෂය තුළ ළමා නිවාස 254 ක් අධීක්ෂණයට ලක් කොට ඇත.

## ළමා හිතකාමී පාසල් පරිසර නිර්මාණය කිරීම

පාසල් ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ දැනුම, අවබෝධය හා කුසලතාවයන් පාසල් ප්‍රජාව තුළ මෙන්ම ළමුන් තුළද වර්ධනය කිරීම හා ඒ සඳහා ඔවුන් ශක්තිමත් කිරීම උදෙසා පාසල් මට්ටමේ යාන්ත්‍රණයක් ඇතිකිරීම තුළින් ළමුන්ගේ යහපැවැත්ම සංවර්ධනය වන පරිසරයක් පාසල් තුළ ඇති කිරීමත්, ඒ සඳහා ක්‍රියාකාරී පාසල් ප්‍රජාවක් නිර්මාණය කිරීමත් මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය වේ.

මෙම වැඩසටහන අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක විය. ඒ අනුව පළමු අදියර යටතේ දැනටමත් පාසල් ළමා ආරක්ෂක කමිටු ක්‍රියාත්මක කර ඇති අධ්‍යාපන කලාපයකින් තෝරාගත්  පාසල් 15 ක, එක් පාසලකින් විදුහල්පතිවරුන් 01 ක් අයෙක්, ගුරුවරුන් 01 ක් අයෙක් ළමුන් 02ක් වශයෙන් 60 කගෙන් යුත් කණ්ඩායමක් හට දිනක විශේෂ පුහුණුවක් ලබා දී ඇත. ඒ අනුව 2016 වර්ෂය තුළදී පළමු අදියරට අදාළව දැනුවත් කිරීමේ වැඩසටහන් 80 ක් පවත්වා ඇති අතර, එමගින් දැනුවත් බව ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 4,228කි.

දෙවන අදියර යටතේ පාසලකින් තෝරාගන්නා කණ්ඩායම කළ යුතු වැඩසටහන සම්බන්ධයෙන් පළමුව ඔවුන් දැනුවත් කිරීමත් ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් යොමු කරන ලද මාර්ගෝපදේශය භාවිතා කරමින් අදාළ කණ්ඩායම විසින් ගුරුවරුන් 05 ක්, දෙමාපියන් 05ක්, ළමුන් 20ක් (හය ශ්‍රේණියෙන් ඉහළ පංති නියෝජනය වන පරිදි) වශයෙන් 20ක කණ්ඩායමක් ඉලක්ක කරගනිමින් මූලික දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ  දැනුවත් කිරීමේ වැඩසටහන් 164ක් පවත්වා ඇති අතර,එමගින් දැනුවත් බව ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 4,764 කි.

තෙවන අදියරේ දී තෝරා ගත් කණ්ඩායම් විසින් සිදු කරන ලද වැඩසටහන් ඇගයීමට ලක් කිරීම හා පසුවිපරම මගින් තවදුරටත් මෙම වැඩසටහන සංවර්ධනය කළ හැක්කේ කෙසේ ද යන්න අධ්‍යයනය කරනුලැබීය. ඒ අනුව 2016 වර්ෂය තුළදී පසු විපරම් වැඩසටහන් 100 ක් පවත්වා ඇත. තවද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව දිවයින පුරා පාසල් තුළ ක්‍රියාත්මක කරනු ලබන "සුරැකුම් පව්ව" නමින් පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂය තුළදි පාසල් 1,112 ක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.





## ග්‍රාමීය මට්ටමින් ළමුන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ප්‍රජා වැඩසටහන් ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ හා ප්‍රජාවගේ ධාරිතා වර්ධනය කිරීමේ දීපව්‍යාප්ත වැඩසටහන

සෑම ළමයෙකුම සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම, අවබෝධය හා කුසලතාවයන් ප්‍රජාව තුළ මෙන්ම ළමුන් තුළ ද වර්ධනය කිරීම හා ඒ සඳහා ප්‍රජා සංවර්ධනය උදෙසා කටයුතු කරන නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන් සහ ප්‍රජාව දැනුවත් කිරීම තුළින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ යාන්ත්‍රණයක් ඇති කිරීම තුළින් ළමුන්ගේ ජීවිත සුරක්ෂිත වන පරිසරයක් ගම් මට්ටමින් නිර්මාණය කිරීම උදෙසා ක්‍රියාත්මක වූ වැඩසටහනකි. මෙහිදී ප්‍රධාන වශයෙන්ම ළමුන්ගේ සුරක්ෂිත බවට ප්‍රබල බලපෑමක් එල්ල කරන යටිතල සාධක වෙනස් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. ඒ අනුව දෙමාපියන් විදේශගතවීම, දිළිඳුකම, විද්‍යුත් මාධ්‍ය භාවිතය, අනවබෝධය හා ආකල්ප, දෙමාපිය ආරවුල්, මධ්‍යසාර හා දුම්වැටි භාවිතය, පවුලේ අසතුට හා අසමගිය, නිවාස පරිසරය හා සංස්කෘතිය යනාදි සාධක සමග කටයුතු කළ යුත්තේ කෙසේද යන්න සාකච්ඡාවට භාජනය කෙරේ. ඒ අනුව, 2016 වර්ෂය තුළදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරින් උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් 150 ක් පවත්වා ඇති අතර, එමගින් දැනුවත් වූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 7445 කි. එමෙන්ම 2016 වසර තුළදී ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 172 ක් පවත්වා ඇති අතර, එමගින් දැනුවත් බව ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 8371කි.

## පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

සෑම ළමයෙකුම සියලුම ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම, අවබෝධය හා කුසලතාවයන් පොලිස් නිලධාරින් තුළ වර්ධනය කිරීම උදෙසා ක්‍රියාත්මක කරනුලැබූ වැඩසටහනකි. ඒ අනුව 2016 වර්ෂය තුළදී ප්‍රජා පොලිස් නිලධාරීන් හා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයෙහි නිලධාරීන් 1,859 දෙනෙක් උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් 13 ක් පවත්වා ඇත.





## සෞඛ්‍ය වෘත්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන

සෞඛ්‍ය වෘත්තිකයන්හට ළමා ආරක්ෂාව, ළමා අයිතිවාසිකම් හා ළමා සංවර්ධනය සම්බන්ධයෙන් දැනුම ලබාදීම උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනුලැබූ වැඩසටහනකි. සෞඛ්‍ය වෘත්තිකයන් ළමා ආරක්ෂාව සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන්හි දැනුමින් හා කුසලතාවලින් සන්නද්ධ කරලීම තුළින් ළමා ආරක්ෂාව සම්බන්ධ වඩාත් සංවේදී වෘත්තිකයන් පිරිසක් බිහිකිරීම, රාජ්‍ය නිලධාරියෙකු ලෙස ළමා අපයෝජනයකදී හෝ එවැනි අවදානම් තත්ත්වයකදී ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් නිසි දැනුම, කුසලතා හා ආකල්ප ලබාදීම තුළින් වඩාත් ඵලදායි ලෙස එම ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කිරීමට අවශ්‍ය මගපෙන්වීම සිදු කිරීමට මෙන්ම සෞඛ්‍ය වෘත්තිකයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමග පවත්වන සබඳතාවය ශක්තිමත් කිරීම තුළින් ළමා අපයෝජන අවම කර ගැනීම සඳහා අවශ්‍ය සහය ලබා ගැනීමත් මෙම වැඩසටහන මගින් අපේක්ෂිතය. මේ අනුව 2016 වර්ෂය තුළදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් හා පශ්චාත් වෛද්‍ය උපාධිය හදාරනු ලබන වෛද්‍යවරුන් උදෙසා වැඩසටහන් 08ක් පවත්වා ඇති අතර, එමගින් දැනුවත් බව ලැබූ සංඛ්‍යාව 479කි.




## ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන

ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ ගුරු වෘත්තියට ප්‍රවේශවීමට අපේක්ෂාවෙන් සිටින ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයන්හි ඉගෙනුම ලබන ගුරු සිසුන් වෙත ළමා ආරක්ෂාව සම්බන්ධ දැනුම හා කුසලතා ලබාදීම තුළින් ළමුන් පිළිබඳ වඩාත් සංවේදී හා සවිඥානික ගුරු පරපුරක් බිහි කිරීමයි. ඒ අනුව 2016 වර්ෂයේදී වැඩසටහන් 9ක් පවත්වා ඇති අතර එමගින් ගුරු සිසුන් 2,172දෙනෙකු දැනුවත් කර ඇත.




## ළමා හිංසනයට එරෙහි ජාතික දිනය සැමරීම



ශ්‍රී ලංකාව විසින් 2009 වර්ෂයේ සිට සෑම වසරකම ජනවාරි 04 දින ළමා හිංසනයට එරෙහි ජාතික දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. 2016 වර්ෂයේ දී ළමා හිංසනයට එරෙහි ජාතික දිනය වෙනුවෙන් ජනමාධ්‍ය මගින් දැනුවත් කිරීමේ වැඩසටහන්, වෙබ් අඩවි සහ සමාජ ජාල හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරන ලදි. එමගින් අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කර ගැනීමට අදාළ ක්‍රමවේදයන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කරන ලදි. විශේෂයෙන් ළමා අපයෝජනයන් පිළිබඳව දැනුම් දීමට ඇති මෙරට කඩිනම්ම යාන්ත්‍රණය වන 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිළිබඳවද මෙහිදි ප්‍රජාව දැනුවත් කරන ලදි.

## ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය සැමරීමේ ජාතික උත්සවය

2016 ජුනි මස 12 වන දිනට යෙදුනු ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය සැමරීම වෙනුවෙන් "ළමයින් ලිංගික ශ්‍රමිකයන් ලෙස භාවිත කිරීම පිටු දකිමු. ළමුන්ට ඔවුන්ගේ ලෝකය උරුම කර දෙමු" යන තේමාව යටතේ විශේෂ ජාතික සමුළුවක් 2016.09.15 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේ දී පවත්වන ලදි.

මෙම සමුළුවේ දී ළමයින් ලිංගික ශ්‍රමිකයින් ලෙස භාවිත කිරීම පිටු දැකීමට අදාළව නිර්දේශ ඉදිරිපත් කළ අතර, එය ඉදිරි කටයුතු සඳහා රජය සහ අදාළ පාර්ශවයන් වෙත යොමු කරන ලදි. මෙම වැඩසටහන් සඳහා 200 කට ආසන්න පිරිසක් සහභාගී වූ අතර, ළමයින් ලිංගික ශ්‍රමිකයින් ලෙස භාවිත කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය කරන යාන්ත්‍රණය පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කෙරිණි. සංචාරක ව්‍යාපාරයේ දියුණුවත් සමග මෙම තත්වය උද්ගත වන බවත් ලිංගික ශ්‍රමිකයන් තුළ මාරාන්තික සමාජ රෝග ඇති වීමේ අවධානමක් පවතින බැවින් එම තත්වය තුරන් කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීමට අවශ්‍ය බවත්, ඒ සඳහා පොලීසිය ඇතුළු අදාළ පාර්ශවයන්ට සුවිශේෂී වගකීමක් පැවරෙන බවත්, මෙහිදි අවධාරණය කෙරිණි. මෙම සංවාදය ආශ්‍රයෙන් සකසන ලද වාර්තාව කෙටුම්පත් කරන ලද ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය සඳහා භාවිත කිරීමටද ලබා දෙන ලදි.









## ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය

ඔක්තොම්බර් මස 11 වැනි දිනට යෙදෙන ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය සැමරීමේ ජාතික වැඩසටහන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සංවිධානය කළ අතර එය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශයේ ලේකම්තුමියගේ හා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමියගේ ප්‍රධානත්වයෙන් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලදි. මෙවර එහි තේමාව වන්නේ "දියණියේ නුඹට නිදහස් ලොවක් අවැසිය සුරක්ෂිත පරිසරයක පරිපූර්ණ වීමට අපි ඔබට අත දෙමු" යන්නයි. මෙම ජාතික වැඩසටහන සඳහා බස්නාහිර පළාතේ පාසල් වල කථික හා විවාද සංගම්, මාධ්‍ය ඒකක යන අංශයන්හි ළමුන් සහභාගි වන ලදි. මෙම ජාතික වැඩසටහන සඳහා 500කට ආසන්න පිරිසක් සහභාගී වූ අතර ගැහැණු ළමයාගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයන් පිළිබඳව සාකච්ඡාවට බඳුන් විය. පාසල් ළමුන්  ඉදිරිපත් කළ සංස්කෘතිකාංග වලින්ද ජාතික උත්සවය අලංකාරවත් වූ අතර, සහභාගී වූ පාසල් සංඛ්‍යාව 22 කි.






මෙම ජාතික වැඩසටහනින් අනතුරුව ලිංගික කටයුතු සඳහා කැමැත්ත දිය හැකි වයස අවුරුදු 16 ලෙසත් විවාහ වීමට ඇති වයස අවුරුදු 18 ලෙසත් නීතියේ සඳහන් වන කාරණා පිළිබඳව විවෘත සංවාදයක් පැවැත්වූ අතර, ඊට අදාළව වාර්තාවක්ද සකසන ලදි. එම වාර්තාව කෙටුම්පත් කරන ලද ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය සඳහා භාවිත කිරීමටද ලබා දෙන ලදි.




## තොරතුරු ලබා දීම

ළමා ආරක්ෂාව, ළමා අපයෝජනය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබා දීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි. එහිදී අවශ්‍යතාවය පරිදි පෝස්ටර්, අත්පත්‍රිකා, පොත්, ස්ටිකර්, මුද්‍රිත ප්‍රකාශන සහ රූපමය වාර්තා වැඩසටහන් ලබාදීම සිදු කරයි.2016 වසරේ බෙදාදෙන ලද ප්‍රකාශන 164,098කි.

### අත්පත්‍රිකා







## ළමා ආරක්ෂාවට අදාළ තොරතුරු ජනමාධ්‍ය හරහා ජනතාව අතරට රැගෙන යාම

රට තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ තොරතුරු ජනමාධ්‍ය ආයතන හා සම්බන්ධීකරණය වෙමින් මහජනතාව අතරට රැගෙන යාමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරයි. ඒ සඳහා විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍යන්ගේ සහයෝගය ද ලබා ගැනේ. ළමා ආරක්ෂාවට අදාළ ව ප්‍රවෘත්ති නිවේදන ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම, විෂය කරුණුවලට අදාළව ප්‍රවෘත්ති සාකච්ඡා පැවැත්වීම ආදිය සිදු කරයි.

එමෙන් ම ගුවන් විදුලි හා රූපවාහිනි වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබාදීම ද සිදු කරයි. 2016 වර්ෂයේ ප්‍රවෘත්ති නිවේදන 8, පුවත්පත් දැන්වීම් 9, විශේෂ මාධ්‍ය සාකච්ඡා 5 ක් සහ රූපවාහිනි දැන්වීම් විකාශය කර ඇත.





## ළමා ආරක්ෂාව පිළිබඳව ළමුන් හා වැඩිහිටියන් දැනුවත් කිරීම සඳහා අන්තර් පාඨශාලා විවාද තරඟාවලිය

ළමා ආරක්ෂාව පිළිබඳව සමාජය තුළ කතිකාවතක් ඇති කිරීමේ සහ ළමා ආරක්ෂාව පිළිබඳව ළමුන් සහ වැඩිහිටියන් දැනුවත් කිරීමේ අරමුණින් 2016 වසරේදී සමස්ත ලංකා මට්ටමෙන් අන්තර් පාඨශාලා විවාද තරඟාවලියක් පැවැත්වීම සිදු කරන ලදි. මෙම වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධ ව ක්‍රියාත්මක විය.

දිස්ත්‍රික් මට්ටමෙන් හා පළාත් මට්ටමෙන් මූලික තරඟ පැවැත්වූ අතර ඉන් තෝරා ගන්නා ලද ජයග්‍රාහී කණ්ඩායම් අවසන් වටයට ඇතුළත් කරනු ලැබීය. අවසන් වටයේ සියලු තරඟ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ඔස්සේ විකාශනය කෙරුණි. ජයග්‍රාහී කණ්ඩායම්වලට සම්මාන ත්‍යාග සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව නිකුත් කරනු ලබන සහතික පත්‍රයක් ද ලබා දීම සිදු විය. 2016 වසරේ සිංහල මාධ්‍ය තරඟ 646 ක් පවත්වා ඇත. තරඟාවලිය සඳහා අයදුම් කරන ලද පාසල් සංඛ්‍යාව 727 කි.

## ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ දිස්ත්‍රික් තරඟ පැවැත්වූ ආකාරය

දිස්ත්‍රික් තරඟ පැවැත්වීමේ වගකීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශිය නිලධාරීන්ට පැවරූ අතර ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කළ නිලධාරීන්ගේද සහය හිමි විය.





## ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ සිංහල මාධ්‍ය අවසන් 32 තරඟ සහ දෙමළ මාධ්‍ය අවසන් තරඟ 32 පැවැත්වීම.

සිංහල මාධ්‍ය අවසන් කණ්ඩායම් 32 හි තරඟ කොළඹ රාජකීය විද්‍යාලයේදී පැවැත්වූ අතර, දෙමළ මාධ්‍ය අවසන් කණ්ඩායම් 32 තරඟ කොළඹ තර්ස්ටන් විද්‍යාලයේදි පවත්වන ලදි. එහිදී සිංහල මාධ්‍ය කණ්ඩායම් 16ක් හා දෙමළ මාධ්‍ය  කණ්ඩායම් 08ක් රූපවාහිනී තරඟ සඳහා තෝරාගන්නා ලදි.






## ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ සිංහල, මාධ්‍ය වැඩමුළුව

විවාද තරඟාවලි සඳහා සහභාගි වූ සිංහල, මාධ්‍ය කණ්ඩායම් අතරින් අවසන් කණ්ඩායම් 32 සඳහා විශේෂ වැඩමුළුවක් 2016.07.09 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදි. එහිදී ළමා ආරක්ෂාව සම්බන්ධව හා විවාද කිරීමේ තාක්ෂණික ක්‍රම පිළිබඳව ද ළමුන් දැනුවත් කරන ලදි. ඒ සඳහා සහභාගි වූ දරුවන් සංඛ්‍යාව 192කි.





## ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරගාවලියේ දෙමළ මාධ්‍ය වැඩමුළුව

විවාද තරගාවලිය සඳහා සහභාගී වූ දෙමළ මාධ්‍ය කණ්ඩායම් අතරින් අවසන් කණ්ඩායම් 8 සඳහා විශේෂ වැඩමුළුවක් 2016.07.23වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදි. එහිදී ළමා ආරක්ෂාව සම්බන්ධව හා විවාද කිරීමේ තාක්ෂණික ක්‍රම පිළිබඳව ද ළමුන් දැනුවත් කරන ලදි. ඒ සඳහා සහභාගී වූ දරුවන් සංඛ්‍යාව 48කි.





## ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරගාවලියේ රූපවාහිනී පටිගත කිරීම් හා විකාශය කිරීම්

දෙවන වටයට තෝරාගත් සිංහල මාධ්‍ය කණ්ඩායම් 32න් 16ක් හා දෙමළ මාධ්‍ය කණ්ඩායම් 32න් 8ක් රූපවාහිනී පටිගත කිරීම් සඳහා සහභාගී කර ගන්නා ලදි. එම පාසල් පහත පරිදි වේ. සියළුම තරග ෂඔහ මාධ්‍ය ජාලයේදී පටිගත කරන ලදි. රූපවාහිනී විකාශය කිරීම් 2016.10.02 සිට 2017.01.15 දින දක්වා සෑම ඉරිදා දිනකම පස්වරු 5.00 සිට 6.00 දක්වා විකාශය විය.

සිංහල මාධ්‍ය
(සුපිරි පාසල් 16 තරඟ)

| විකාශනය වු දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2016.10.02 | නික/බමුණුගම මහා විද්‍යාලය | ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර |
| 2016.10.09 | රාජකීය විද්‍යාලය - කොළඹ | බප/පිළි/ශුද්ධ වු පවුලේ කන්‍යාරාමය |
| 2016.10.16 | මහා/ශා/සිල්වෙස්තර පිරිමි විදුහල | මහ/නුගවෙල මධ්‍ය විද්‍යාලය |
| 2016.10.23 | කුලි/නාගොල්ලාගොඩ මධ්‍ය මහා විද්‍යාලය | පො/තෝපාවැව මහා විද්‍යාලය |
| 2016.10.30 | කු/මලියදේව පිරිමි විදුහල | කුලි/කුලියාපිටිය මධ්‍ය විද්‍යාලය |
| 2016.11.06 | හ/ථේරපුත්ත ජාතික පාසල | ගම්/බණ්ඩාරනායක විද්‍යාලය |
| 2016.11.13 | හලා/ආනන්ද ජාතික පාසල | ආනන්ද විද්‍යාලය - කොළඹ |
| 2016.11.20 | මා/සාන්ත තෝමස් විදුහල | ශා/ජොශප් වාස් විද්‍යාලය - වෙන්නප්පුව |

සිංහල මාධ්‍ය
(අර්ධ අවසන් පූර්ව තරඟ)

| විකාශනය වු දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2016.11.27 | රාජකීය විද්‍යාලය - කොළඹ | ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර |
| 2016.12.04 | මහා/ශා/සිල්වෙස්තර පිරිමි විදුහල | පො/තෝපාවැව මහා විද්‍යාලය |
| 2016.12.11 | ගම්/බණ්ඩාරනායක විද්‍යාලය | කු/මලියදේව පිරිමි විදුහල |
| 2016.12.18 | මා/සාන්ත තෝමස් විදුහල | හලා/ආනන්ද ජාතික පාසල |

සිංහල මාධ්‍ය
(අවසන් පූර්ව තරඟ)

| විකාශනය වූ දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2016.12.25 | රාජකීය විද්‍යාලය - කොළඹ | මහා/ශා/සිල්වෙස්තර පිරිමි විදුහල |
| 2016.01.01 | මා/සාන්ත තෝමස් විදුහල | කු/මලියදේව පිරිමි විදුහල |

සිංහල මාධ්‍ය
(අවසන් මහා තරඟ)

| විකාශනය වූ දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2017.01.15 | රාජකීය විද්‍යාලය - කොළඹ | මහා/ශා/සිල්වෙස්තර පිරිමි විදුහල |

දෙමළ මාධ්‍ය
(අවසන් පූර්ව තරඟ)

| විකාශනය වූ දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2016.12.25 | රාජකීය විද්‍යාලය - කොළඹ | ෂංමුගාහින්දු විද්‍යාලය-ත්‍රිකුණාමලය |
| 2017.01.01 | පුත්තලම ජනාධිපති විද්‍යාලය | වින්සන්ට් උසස් විද්‍යාලය-මඩකලපුව |

දෙමළ මාධ්‍ය
(අවසන් මහා තරඟ)

| විකාශනය වූ දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2017.01.08 | ෂංමුගාහින්දු විද්‍යාලය-ත්‍රිකුණාමලය | වින්සන්ට් උසස් විද්‍යාලය-මඩකලපුව |

දෙමළ මාධ්‍ය
(තරඟවට 08 සුපිරි පාසල්)

| විකාශනය වූ දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2016.11.27 | ෂංමුගාහින්දු විද්‍යාලය-ත්‍රිකුණාමලය | වින්සන්ට් උසස් විද්‍යාලය-මඩකලපුව |
| 2016.12.04 | රාජකීය විද්‍යාලය - කොළඹ 07 | කැකුණගොල්ල මහා විද්‍යාලය - කුරුණෑගල |
| 2016.12.11 | ර/සී/සීදෙමළ මහා විද්‍යාලය - බළන්ගොඩ | පුත්තලම ජනාධිති විද්‍යාලය |
| 2016.12.18 | හින්දු බාලිකා විද්‍යාලය - යාපනය | වින්සන්ට් උසස් විද්‍යාලය - මඩකලපුව |

දෙමළ මාධ්‍ය
(අවසන් පූර්ව තරඟ)

| විකාශනය වූ දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2016.12.25 | රාජකීය විද්‍යාලය - කොළඹ 07 | ෂංමුගාහින්දු විද්‍යාලය-ත්‍රිකුණාමලය |
| 2017.01.01 | පුත්තලම ජනාධිති විද්‍යාලය | වින්සන්ට් උසස් විද්‍යාලය - මඩකලපුව |

දෙමළ මාධ්‍ය
(අවසන් මහා තරඟ)

| විකාශනය වූ දිනය | යෝජක | ප්‍රතියෝජක |
|---|---|---|
| 2017.01.08 | ෂංමුගාහින්දු විද්‍යාලය-ත්‍රිකුණාමලය | වින්සන්ට් උසස් විද්‍යාලය-මඩකලපුව |

## අන්තර් පාඨශාලයීය විවාද තරඟාවලියේ විශේෂ අවස්ථා










## ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ අවසන් මහා තරඟ

සමස්ත ලංකා අන්තර් පාඨශාලයීය විවාද තරඟාවලියේ සමස්ත ලංකා අවසන් මහා තරඟ 2016.11.04 වන දින උත්සවශ්‍රීයෙන් ෂඕහ මාධ්‍ය ජාලයේදී පවත්න ලදි. සිංහල මාධ්‍ය අවසන් මහා තරඟය මහනුවර සිල්වෙස්තර විද්‍යාලය සහ කුරුණෑගල මලියදේව විද්‍යාලය අතර පවත්වන ලදි. ශූරතාවය මහනුවර සිල්වෙස්තර විද්‍යාලය සතු වූ අතර අනුශූරතාව කුරුණෑගල මලියදේව විද්‍යාලය සතු විය. දෙමළ මාධ්‍ය අවසන් මහා තරඟය මඩකලපුව වින්සන්ට් උසස් විද්‍යාලය හා ත්‍රිකුණාමලය ෂංමුගා හින්දු විද්‍යාලය අතර පැවති අතර ශූරතාවය මඩකලපුව වින්සන්ට් උසස් විද්‍යාලය සතුවූ අතර අනුශූරතාව ත්‍රිකුණාමලය ෂංමුගා හින්දු විද්‍යාලය සතුවිය. ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග, කුසලාන, පදක්කම් සහ සහතික පත්‍ර පිරිනැමීම කාන්තා හා ළමා කටයුතු ගරු අමාත්‍ය චන්ද්‍රානි බණ්ඩාර මැතිනියගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි.











## ළමා ආරක්ෂාව පිළිබඳව වූ විවාද තරඟාවලියේ ත්‍යාග සහ සහතික පත්‍ර

- සමස්ත ලංකා ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග, සහතිකපත්, පදක්කම් හා කුසලාන පිරිනැමිණි. ත්‍යාග සඳහ අනුග්‍රාහකත්වය ලංකා බැංකුව මගින් ලබාදෙන ලදි. එහි වටිනාකම රුපියල් මිලියන එකකි.
- දිස්ත්‍රික් ජයග්‍රාහකයන් සහ තරඟාවලියට සහභාගී වූ අනෙකුත් පාසල් සඳහා ද සහභාගිත්ව සහතික පිරිනමන ලදි.
- සියලු සහතික ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ අධ්‍යාපන අමාත්‍යංශය ඒකාබද්ධව නිකුත් කෙරිණි.

## ළමා ආරක්ෂාව පිළිබඳව කෙටි චිත්‍රපට තරඟාවලියක්



ළමා ආරක්ෂාව පිළිබඳව පියාගේ භූමිකාව කුමක් ද යන්න පදනම්කර ගනිමින් මෙම කෙටි චිත්‍රපට තරඟාවලිය පවත්වන ලදි. මෙය පාසල් අංශය හා විවෘත අංශය වශයෙන් තරඟ අංශ දෙකක් ඔස්සේ පැවැත්වූ අතර, කෙටි චිත්‍රපට තරඟාවලිය සුදුසුකම් ලත් විනිශ්චය මණ්ඩලයක් මගින් විනිශ්චය කරන ලදි. ජයග්‍රාහී කෙටි චිත්‍රපට රූපවාහිනී මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීම සඳහා මෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහාද භාවිත කරන ලදි. ජයග්‍රාහකයන්හට පදක්කම් ත්‍යාග හා සහතික පත් පිරිනැමීමද සිදු කරන ලදි.









## ළමා ආරක්ෂාව විෂය පිළිබඳව පාසල් මාධ්‍ය ඒකක සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහනක්




අපයෝජනවලින් ළමයින් ආරක්ෂා කර ගැනීමට අදාළ තොරතුරු පාසල් මාධ්‍ය ඒකක හරහා පාසල තුළ ප්‍රචලිත කිරීම මෙම වැඩසටහනේදී සිදු කෙරේ. පාසල තුළ දෛනිකව ක්‍රියාත්මක වන ක්‍රියාකාරී ඒකකයක් වන පාසල් මාධ්‍ය ඒකකය මගින් පාසල තුළ ප්‍රචාරය කරනු ලබන ප්‍රවෘත්ති, විනෝදාස්වාද වැඩසටහන්, හා අනෙකුත් වැඩසටහන් තුළට ළමා ආරක්ෂාව පිළිබඳ පණිවිඩ අන්තර්ගත කිරීම මගින් එම පණිවිඩ ගුරුවරුන් සහ සිසුන්ට යන දෙපාර්ශවයටම මනාව සන්නිවේදනය කිරීම මෙහිදී මූලිකවම සිදු කෙරේ. එම වැඩසටහන් නිර්මාණය කිරීම හා ඉදිරියට පවත්වාගෙන යාම පිළිබඳ සිසු සිසුවියන්ට අදාළ විෂය පිළිබඳව පුහුණුවක් ලබා දීම සිදු කරයි. ඊට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහය කැලණිය විශ්වවිද්‍යාලයේ ද සහයෝගයෙන් සකසා ඇත. මෙය අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක්ව සංවිධානය කරනු ලබන වැඩසටහනකි.

## ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම

ශ්‍රි ලංකාවේ විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් අධ්‍යාපනික ප්‍රදර්ශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලබන අතර, ලැබෙන ඉල්ලීම් මත එම ප්‍රදර්ශන සඳහා ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ අධ්‍යාපනික ප්‍රදර්ශන, ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලබයි. මෙහිදී ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු ඇතුළත් අත්පත්‍රිකා හා පෝස්ටර් බෙදා හැරීමද සිදු කරනු ලබන අතර, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් නිර්මාණය කරනු ලබන වීඩියෝ පට ප්‍රදර්ශනය කිරීමද සිදු කරනු ලැබේ.





## ළබැඳි පුවත් හසුන

පුවත් හසුනකට වඩා වැඩි යමක් යන තේමාව යටතේ සැකසුණු ළබැඳි නමින් වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල පුවත් හසුන 2016 වර්ෂයට අදාළව ඔක්තොම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි. ළමා ආරක්ෂාව පිළිබඳ ව ගුරුවරුන්, දෙමාපියන්, ළමුන් ඇතුලු සියලු ප්‍රජාව දැනුවත් කිරීමට සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් පුවත් හසුන ප්‍රකාශයට පත්කෙරෙයි. මෙහි මූලික අරමුණ වන්නේ ළමා ආරක්ෂාව පිළිබඳව සමස්ත ප්‍රජාවම දැනුවත් කිරීමයි.






## මාධ්‍ය ප්‍රචාරණ දැන්වීම්

ළමා ආරක්ෂාව පිළිබඳව පහත සඳහන් පරිදි ප්‍රචාරණ දැන්වීම් 3 ක් 2016 වර්ෂයේ දී නිෂ්පාදනය කරන ලදි. එහි අන්තර්ගතය පහත තේමාවන්ට අදාළ විය.



- ළමා ආරක්ෂාව සම්බන්ධව පවුල තුළ පියවරුන්ගේ භූමිකාව
- ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව දෙමව්පියන්ගේ අවධානය යොමු කිරීම
- ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව ළමයින්ම සැළකිලිමත් වීම
- 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ප්‍රචලිත කිරීම

මෙම දැන්වීම් සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් ජනමාධ්‍ය ආයතන තුළ ප්‍රචාරය කරන ලදි. එය දෙරණ මාධ්‍ය ජාලය, එජ්ක මාධ්‍ය ආයතනය, ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව සහ එඹඪ මාධ්‍ය ආයතනයවල සහ තෝරාගත් ගුවන් විදුලි ආයතන හරහා ප්‍රචාරය කරන ලදි. එහිදී ඒ සඳහා සාමාන්‍ය ප්‍රජාවගෙන් ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබුනු අතර, එම දැන්වීම් වැඩිම පිරිසක් රූපවාහිනිය නරඹන වේලාවන් තුළ ප්‍රචාරය කිරීම මගින් බොහෝ පිරිසක් වෙත අදාළ කරුණු ගෙන යාමට හා සමාජය තුළ ඒ පිළිබඳ පුළුල් කථිකාවතක් ඇති කිරීමට හැකි විය. එමෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල ෆේස්බුක් ගිණුම හා නිල වෙබ් අඩවිය මගින්ද මෙම දැන්වීම් ප්‍රචාරය කිරීමට කටයුතු සිදු කරන ලදි.





## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය සංවර්ධනය කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා පුස්තකාලාධිපතිනියක් 2016 වර්ෂයේදි බඳවා ගත් අතර, මේ වන විට එකී පුස්තකාලය ළමා ආරක්ෂාව පිළිබඳව තොරතුරු ඇතුළත් විශේෂ පුස්තකාලයක් ලෙස සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කරමින් සිටි. ළමා ආරක්ෂාව විෂයට අදාළ පර්යේෂණ, දේශීය විදේශිය ග්‍රන්ථ මෙන්ම වෙනත් ප්‍රකාශන රැසක් ඊට ඇතුළත් කර ඇත. අභ්‍යන්තර වශයෙන් කටයුතු කරන නිලධාරින්ට මෙන්ම බාහිර වශයෙන් පැමිණෙන පුද්ගලයින්ටද එය පරිශීලනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.

## ළමා ආරක්ෂාව පිළිබඳ නිර්මාණය කෙරෙන නව වෙබ් අඩවිය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියට අමතරව ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු ඇතුළත් නව වෙබ් අඩවියක් 2016 වර්ෂයේ දී නිර්මාණය කිරීමට මූලික කටයුතු සංවිධානය කෙරිණි. ළමා අපයෝජනවලින් ළමුන් ආරක්ෂා කර ගනිමින් ඔවුන්ට සුරක්ෂිත වටපිටාවක් උරුමකර දීමට අදාළ තොරතුරු එම නව වෙබ් අඩවියට ළමා හිතකාමී ලෙස ඇතුළත් කිරීමට කටයුතු කෙරේ. ගුරුවරුන්ට, වැඩිහිටියන්ට මෙන්ම දරුවන්ටද පහසුවෙන් පරිශීලනය හා අවබෝධ කර ගත හැකි මට්ටමින් මෙම වෙබ් අඩවිය පවත්වාගෙන යනු ලබන අතර, ළමා ආරක්ෂාවට අදාළව නිර්මාණය කරන වීඩියෝ හා වැඩසටහන්ද ඒ තුළට අන්තර්ගත කරනු ලැබේ.



## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය ත්‍රෛයිභාෂාවන්ට හැරවීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය වන www.childprotection.gov.lk වෙබ් අඩවිය පරිශිලිකයන්ගේ පහසුව සඳහා සිංහල දෙමළ හා ඉංග්‍රිසි යන ත්‍රෛයි භාෂාවන්ගෙන් සැකසීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදි. නිරන්තරයෙන් යාවත්කාලීන වන මෙමගින් ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු, නිල නිවේදන, ළමා ආරක්ෂාව පිළිබඳ නිර්මාණය වන ප්‍රකාශන, උපදේශන සේවා සේවා ආදිය පහසුවෙන් දැන ගැනීමේ හැකියාව පවති.




## ළමා ආරක්ෂාව පිළිබඳව අත්පත්‍රිකා හා පෝස්ටර් ඇතුළු මුද්‍රිත මෙවලම් නිර්මාණය

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් ළමා ආරක්ෂාව පිළිබඳව තොරතුරු ඇතුළත් අත්පත්‍රිකා, පොස්ටර් ඇතුළු මුද්‍රිත මෙවලම් මගින් ළමා ආරක්ෂාව පිළිබඳව දරුවන්, ගුරුවරුන්, ඇතුළු සමස්ත ප්‍රජාවම දැනුවත් කිරීම සිදුකරන ලදි. එහිදි ළමුන් ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කළයුතු ආකාරය පහසුවෙන් කියවා අවබෝධ කරගත හැකි පරිදි හා දෙමාපියන්, වැඩිහිටියන් ළමුන් ආරක්ෂා කරගැනීමට අවධානය යොමු කළයුතු ආකාරය පිළිබඳ මූලිකවම එහි අන්තර්ගත විය. මෙම සෑම නිර්මාණයක් මගින් 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිළිබඳ අවබෝධය ලබාදීමද සිදු විය.







## 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව

ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 14 (ඔ) වගන්තිය ප්‍රකාරව ළමා අපචාර පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම යන්න වඩාත් ඵලදායී සහ කාර්යක්ෂමව කිරීම සඳහා 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය 2010 ජූලි 22 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදි. මෙය ළමා අපයෝජන පැමිණිලි භාර ගැනීම හා ඒවාට කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමුඛතම යාන්ත්‍රණයද වේ. එමගින් සමාජය තුළ සැඟව තිබූ ළමා අපයෝජන සිදුවීම් වාර්තාවීමේ වර්ධනයක්ද දක්නට ලැබේ.

ගාස්තු අය කිරීමකින් තොරව ක්‍රියාත්මක වන සේවාව ඇමතීම මගින්, ඕනෑම පුද්ගලයෙකුට ළමයින් සම්බන්ධයෙන් පැන නගින ගැටළුමෙන්ම ළමා අපයෝජන සම්බන්ධයෙන් පැමිණිලි සිදු කිරීමට ද හැකියාව පවතියි.

මෙමගින් උපදේශන සේවය ලබා ගැනීමටද අවස්ථාව ලැබේ. මෙම සේවාව මූලිකව ළමුන් සඳහා වෙන්ව ඇතත් ගුරුවරුන්, දෙමව්පියන් සහ ළමා රැකවරණ සපයන්නන් වන වැඩිහිටියන්ටද, ළමුන් පිළිබඳ ඔවුන්ට ඇති ගැටළු ළමුන් හදාවඩා ගැනීමේ පරිචයන් ආදිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාත් භාවිතා කළ හැකිය. 2016 වසරේ දුරකථන ඇමතුම් 177,338 ක් ලැබී ඇති අතර ඉන්, 8,810 ක ප්‍රමාණයක් මූලික පැමිණිලි ලෙස හඳුනාගෙන ඇත. ඉදිරි විමර්ශන ක්‍රියාව තුළදී මෙම පැමිණිලිවලින් කිසියම් ප්‍රමාණයක් අසත්‍ය හා සාක්ෂි නොමැති වීම හේතුකොට ඉවත් වේ.



## ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහිපයකි. 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය හරහා පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබෙන අතර, අධිකාරියට පැමිණ පැමිණිලි ඉදිරිපත් කිරීම මගින් ද, ලිපි, ෆැක්ස් සහ ඊ මේල් මගින්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැමිණිලි සිදු කරනු ලබයි. මෙම ලැබෙන පැමිණිලි සියල්ල කඩිනමින් විභාගයට ගැනෙන අතර, පැමිණිල්ලේ ස්වභාවය අනුව වර්ග කිරීමකට ලක් වේ. 2016 වසරේදී මෙම සියලු මාර්ග වලින් පැමිණිලි 9,361 ක් ලැබී ඇත.

| දිස්ත්‍රික්කය | ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| අම්පාර | 183 |
| අනුරාධපුර | 521 |
| බදුල්ල | 271 |
| මඩකලපුව | 148 |
| කොළඹ | 1271 |
| ගාල්ල | 635 |
| ගම්පහ | 917 |
| හම්බන්තොට | 412 |
| යාපනය | 169 |
| කළුතර | 558 |
| මහනුවර | 407 |
| කෑගල්ල | 351 |
| කිලිනොච්චි | 116 |

| | |
|---|---|
| කුරුණෑගල | 722 |
| මන්නාරම | 68 |
| මාතලේ | 192 |
| මාතර | 307 |
| මොණරාගල | 252 |
| මුලතිව් | 119 |
| නුවරඑළිය | 211 |
| පොළොන්නරුව | 221 |
| පුත්තලම | 463 |
| රත්නපුරය | 593 |
| ත්‍රිකුණාමලය | 139 |
| වව්නියාව | 115 |
| **මුළු සංඛ්‍යාව** | **9361** |

## නීතිමය කර්තව්‍යන්

අපයෝජනයට ගොදුරුවූ ළමුන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම, ළමා අපයෝජන පිටුදැකීම සඳහාවූ නීතිමය පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම, නීති උපදෙස් ලබාදීම සහ ළමා අපයෝජන සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම හා ඊට අදාළව අධිකරණයෙහි පෙනීසිටීම යනාදී කාර්යයන් නීති අංශය මගින් ඉටු කරනු ලබයි. අධිකාරි පනතට අමතරව පහත පනත්වලට අදාළවද කටයුතු කරයි.

- 2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත
- 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ක්‍රියාත්මක නීති අංශය මගින් 2016 වර්ෂයේ දී නීති උපදෙස් ලබාදීම් යටතේ දුරකථන මාර්ගයෙන් 1710 ක් සහ සේවාලාභීන් 169 ක් අධිකාරියට පැමිණ පැමිණිලි ලබාදී ඇත. එමෙන්ම අධිකරණයේ නඩු සඳහා පෙනීසිටීම් 114 ක් සඳහා සහභාගි වී ඇත. රැස්වීම් 125 කට සහභාගි වී ඇත

**2016 වසර තුළ දි නීති අංශය දායක වූ නඩු සංඛ්‍යාව 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ) විධිවිධාන පනත අනුව**

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| බත්තරමුල්ල ළමා අධිකරණය | 07 |
| ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 17 |
| කල්මුණේ අධිකරණය | 21 |
| බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| මාතර මහේස්ත්‍රාත් අධිකරණය | 18 |
| කළුතර මහේස්ත්‍රාත් අධිකරණය | 07 |
| බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය | 17 |
| ***මුළු සංඛ්‍යාව*** | **91** |

2016 වසර තුළ නීති අංශය දායක වූ නඩු සංඛ්‍යාව (ළමා අපයෝජන සිද්ධි සඳහා)

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| බත්තරමුල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණය | 03 |
| ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය | 06 |
| කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 01 |
| *මුළු සංඛ්‍යාව* | 13 |

## ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතයන් බවට පත්වන ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ විශේෂ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකයක් ක්‍රියාත්මක වේ. 1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධි විධාන) පනත ප්‍රකාරව අපයෝජනයට ගොදුරු වී ඇති ළමයෙකුගේ සාක්ෂිය වීඩියෝ පටිගතකර එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීමටත් මෙමගින් ඉඩ සැලසේ. මෙම වසරේ දී වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 167ක ප්‍රමාණයක් නිමකොට ඇත. එමෙන්ම ඉල්ලීම් ලද අධිකරණ සඳහා පටිගත කළ සාක්ෂි පිටපත් 88 ක් මුදාහැර ඇත.

## අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය ක්‍රියාත්මක කිරීම

ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම හා මාධ්‍ය හරහා සිදු කරනු ලබන අසභ්‍ය පළකිරීම් හා ප්‍රකාශන වැලැක්වීම යන කටයුතු සිදු වන්නේදැයි විමර්ශනය කර බැලීම සහ අධිකාරියට ලැබෙන පැමිණිලිවලට අදාළ විමර්ශන කටයුතු මෙම ඒකකය තුළින් ක්‍රියාත්මක වේ.

ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම, එවැනි තත්ත්වයන් අන්තර්ජාලය තුළ පවතීද යන්න සොයා බැලීම, ළමුන් අන්තර්ජාලය නිවැරදිව භාවිතා කරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් දැනුවත් කිරීම, අන්තර්ජාලය අවභාවිතා කිරීමකින් තොරව ළමුන්ගේ සංවර්ධනය උදෙසා භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව දෙමාපියන්, නිලධාරීන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අන්තර්ජාලය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත කරන සහ අන්තර්ජාලය භාවිත කරමින් කටයුතු කරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමග සම්බන්ධීකරණය හා අවශ්‍ය මැදිහත්කරණය සිදු කිරීම, ළමුන්, නිලධාරීන් සහ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය අත්පත්‍රිකා, පෝස්ටර් සකස් කිරීම මින් සිදු කරයි. 2016 වසරේදී වැඩසටහන් 41 ක් සහ ප්‍රතිලාභීන් 7,710 ක් දැනුවත් කරන ලදි.

2016 වර්ෂයේ අන්තර්ජාල සුරක්ෂිතතාවය පිළිබඳ වැඩසටහන

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| ළමුන් දැනුවත් කිරීම | 23 | 3845 |
| දෙමාපියන් සහ ප්‍රජාව දැනුවත් කිරීම | 11 | 3115 |
| නිලධාරීන් දැනුවත් කිරීම | 07 | 750 |
| මුළු සංඛ්‍යාව | 41 | 7710 |





## විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ඔස්සේ හා වෙනත් ක්‍රම මගින් මහජනතාවගෙන් ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය කටයුතු කරමින් සිටී. ඒ සඳහා 24 පැය පුරාවටම ක්‍රියාත්මක වන, නිළධාරීන් 34ක ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් යොදවා ඇත. 2016 වර්ෂයේදී මෙම ඒකකයට පැමිණිලි 205 ක් ලැබී ඇත.

2016 වර්ෂයේදී විශේෂ පොලිස් විමර්ශන ඒකකයට සෘජුව ලැබුණු පැමිණිලි

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි ගණන | විමර්ශනයේ වර්තමාන තත්ත්වය (මූලික පොලිස් විමර්ශන) | අධිකරණයේ විභාග වන ගණන | අධිකරණයේ විභාග අවසන් ගණන |
|---|---|---|---|---|
| සුළු අපරාධ | 42 | අවසන් | 42 | 42 |
| විවිධ පැමිණිලි | 140 | අවසන් | 16 | 03 |
| බාල අපරාධ | 23 | 21 | 22 | - |
| **මුළු සංඛ්‍යාව** | **205** | **21** | **80** | **45** |

## අන්තර්ජාලය සහ වෙනත් ජංගම දුරකථන අනිසි ලෙස පරිහරණය කිරීම හරහා ළමයින්ට ලිංගික වශයෙන් සහ වෙනත් ආකාරවලින් හිංසා කිරීම පිළිබඳ පැමිණිලි කිරීමට 0773220032 හා 0713220046 නමින් වෙනම ම දුරකථන අංක දෙකක්




අන්තර්ජාලය සහ වෙනත් ජංගම දුරකථන අනිසි ලෙස පරිහරණය කිරීම හරහා ළමයින්ට ද ලිංගික වශයෙන් සහ වෙනත් ආකාරවලින් හිංසා කිරීම සහ හිරිහැරයට පත් කිරීම්වලට එරෙහිව කටයුතු කරමින් එය වළක්වාලීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වර්තමානයේ විවිධ පැතිකඩ හරහා කටයුතු කරමින් සිටියි.

මේ සම්බන්ධයෙන් ගෙන ඇති නවතම ක්‍රියාමාර්ගය වන්නේ අන්තර්ජාලය ඔස්සේ හෝ ජංගම දුරකථන හරහා හිංසාවට පත්වන්නන්ගේ තොරතුරු 1929 ඔස්සේ හෝ අධිකාරියේ ප්‍රධාන දුරකථන මාර්ග ඔස්සේ හෝ තැපැල මගින් හෝ ෆැක්ස් පණිවුඩ මගින් ලැබෙන පැමිණිලි අධිතාක්ෂණික මෘදුකාංග මගින් හා අදාළ ජංගම සේවා සැපයුම්කරුවන් සමග රහස්‍යභාවය ආරක්ෂාවන අන්දමින් කරනු ලබන විමර්ශන මගින් සේවාදායකයන් හට සහන සලසා දීමයි. මේ සම්බන්ධව නියමු ව්‍යාපෘතියක් ලෙස පැමිණිලි ලබා දීම සඳහා 0773220032 හා 0713220046 දරණ අංක දෙක හඳුන්වා දීම සිදු කරන ලදි.

## මනෝසමාජීය ක්‍රියාකාරකම්

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ ක්‍රියාත්මකවන මනෝසමාජීය අංශය මගින් ළමුන්ගේ මානසික යහපැවැත්ම හා උපරිම යහපත වෙනුවෙන් මනෝ උපදේශන සේවා හා මනෝචිකිත්සක සේවා සැපයීම, වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා පැමිණෙන ළමුන් තුළ සැහැල්ලු මානසිකත්වයක් ගොඩනගමින් පූර්ව සූදානම් කිරීම, සිද්ධි සම්මන්ත්‍රණ සඳහා දායකත්වය ලබාදීම, මනෝ සමාජීය සහයන් සහ මානසික තක්සේරු කිරීම්, ළමුන් සහ සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්, මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය හරහා ළමුන්ගේ උපරිම යහපත හා සුරක්ෂිතභාවය සඳහා උපදෙස් ලබා දීම, මඟ පෙන්වීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

1929 ළමා දුරකථන සේවාව වෙත යොමුවන පැමිණිලි හා ඍජු ලෙස අංශය වෙතට යොමුවන පැමිණිලිවලට අදාළ උපදේශනය හා අවශ්‍ය මනෝසමාජීය සහයන් ලබාදීම හා එම සහයන් ලබා දිම සඳහා දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරින් වෙත යොමු කරවීමද සිදු කරයි. තවද ළමුන් තුළ පෞරුෂත්ව වර්ධනය කිරීම, නිර්මාණශීලිත්වය ගොඩනැගීම. ධනාත්මක ආකල්ප ඇති කරලීම සඳහා මනෝසමාජීය ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි. 2016 වසරේ මනෝ උපදේශන හා මනෝචිකිත්සක සේවා 203 ක් ලබා දී ඇත. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා පැමිණෙන ළමුන් පූර්ව සූදානම් කිරීම 168 කි. විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් 15 ක් සිදු කර ඇති අතර මනෝසමාජීය සහය සැපයීම් 746 කි. මනෝසමාජීය අංශය වෙත 1929 හරහා යොමුවූ ඍජු පැමිණි සංඛ්‍යාව 118කි. අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු විවිධ අමාත්‍යාංශවල අදාළ ජාතික කමිටු හා අනෙකුත් රැස්වීම් සඳහා සහභාගිත්වය හා සක්‍රීය දායකත්වය ලබාදීම් 238 කි. මනෝසමාජීය අංශය මගින් යොමු කළ පසුවිපරම් සංඛ්‍යාව 712 කි. මනෝ සමාජීය මැදිහත්කරණය ලබාදී අවසන් කර නීතිය බලාත්මක කිරීමේ අංශය වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව 402 කි.

## හදිසි ආපදා අවස්ථාවලදී ළමුන් සඳහා මනෝසමාජීය සහයන් ලබාදීම

මෙම වසරේ ගංවතුර හේතුවෙන් හදිසි ආපදාවට පත්වූ ළමුන් සඳහා මනෝසමාජීය සහයන් ලබාදීමට අවශ්‍ය පොදු සැලැස්මක් සකස් කරන ලදි. තවද එම සැලැස්ම පිළිබඳව අදාල රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් ද දැනුවත් කිරීම සිදු කරන ලදි.

## ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන

ළමා ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කරනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම සහ ළමා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම ළමා කේන්ද්‍රිය මධ්‍යස්ථාන තුළින් සිදුවේ. අධිකාරිය විසින් 2009 වසරේදී ප්‍රථම ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථානය වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පිහිටුවමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයන්හි ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි.
මේ වන විට මුලතිව්, වව්නියාව, කිලිනොච්චිය, හම්බන්තොට, මන්නාරම සහ කළුතර යන දිස්ත්‍රික්කයන්හි ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථාන පිහිටුවා ඇත. කළුතර ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථානය 2016 වසරේදී පිහිටුවන ලදි.

# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

( රුපියල් වලින් )

| විස්තරය | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| ආදායම් | | | |
| පුනරාවර්තන ප්‍රදාන - මහාභාණ්ඩාගාරය | | 240,703,967.00 | 235,370,000.00 |
| -අනෙකුත් ආයතන | 1 A | 1,094,000.00 | 10,785,633.18 |
| අනෙකුත් ආදායම් | 1 B | 271,179.72 | 1,404,514.46 |
| ජාතික ක්‍රියාකාරිසැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 155,812,159.96 | 47,000,000.00 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන | 1 C | 214,000.00 | 578,958.69 |
| මුළු ආදායම | | **398,095,306.68** | **295,139,106.33** |
| වියදම් | | | |
| පරිපාලන වියදම් | 2 | 208,768,284.47 | 215,628,638.10 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3 | 156,606,259.76 | 56,510,468.86 |
| ව්‍යාපෘති වියදම් | 4 | 2,564,263.33 | 13,316,523.93 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම් | 5 | 424,848.10 | 10,666,550.00 |
| මූල්‍ය වියදම් | 6 | 30,340.29 | 28,910.50 |
| මුළු වියදම් | | **368,393,995.95** | **296,151,091.39** |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) | 7 | **29,701,310.73** | **(1,011,985.06)** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2016.12.31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශය

( රුපියල් වලින් )

| විස්තරය | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ***ජංගම නොවන වත්කම්*** | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 103,863,315.64 | 94,509,420.04 |
| කල්බදු ඉඩම් | | 23,265,988.71 | - |
| ආයෝජන හා ඉතිරිකිරීම් | 9 | 9,734,766.20 | 14,204,700.25 |
| දිගුකාලීන ලැබිය යුතු වත්කම් | 10 | 100,226.70 | 132,136.00 |
| | | **136,964,297.25** | **108,846,256.29** |
| ***ජංගම වත්කම්*** | | | |
| භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය | | 439,315.09 | 613,759.21 |
| ආපදා ණය | | 470,734.14 | 470,734.14 |
| ලැබිය යුතු ගිණුම් | 11 | 44,339,323.96 | 41,122,861.18 |
| පෙර ගෙවීම් | 12 | 2,588,313.31 | 510,399.98 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 13 | 42,046,055.76 | 23,697,526.73 |
| | | **89,883,742.26** | **66,415,281.24** |
| **මුළු වත්කම්** | | **226,848,039.51** | **175,261,537.53** |
| **වගකීම්** | | | |
| ***ජංගම නොවන වගකීම්*** | | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 7,506,274.00 | 6,002,385.96 |
| සීමා සහිත අරමුදල් | 14 | 465,404.00 | 465,404.00 |
| ව්‍යාපෘති අතිරික්තය හෝ (ඌනතාවය) | 15-A | 5,924,566.82 | 14,647,830.15 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 15-B | (10,770,674.73) | (10,559,826.63) |
| | | **3,125,570.09** | **10,555,793.48** |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 16 | 39,026,448.57 | 21,762,942.20 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 17 | 944,850.14 | 1,137,611.14 |
| | | **39,971,298.71** | **22,900,553.34** |
| **මුළු වගකීම්** | | **43,096,868.80** | **33,456,346.82** |
| ***ශුද්ධ වත්කම්*** | | **183,751,170.72** | **141,805,190.71** |
| ***මූල්‍යනය වන්නේ*** | | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | 18 | 161,106,534.39 | 150,542,976.54 |
| ප්‍රාග්ධන සංචිත | | 2,153,119.00 | 2,153,119.00 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 13,000,000.00 | 13,000,000.00 |
| රඳවාගත් ඉපැයුම් | | 7,491,517.33 | (23,890,904.83) |
| | | **183,751,170.72** | **141,805,190.71** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

( රුපියල් වලින් )

| විස්තරය | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වු අතිරික්තය / (ඌනතාවය) | | 29,701,310.73 | (1,011,985.06) |
| **මුදල් නොවන සංචලනයන්** | | | |
| ක්ෂයවීම් | | 15,758,474.58 | 10,141,621.62 |
| කල්බදු ණය ක්‍රමක්ෂය | | 3,474,228.26 | - |
| ක්‍රමක්ෂය වූ සුනාමි ආධාර මුදල | | (7,253,000.00) | - |
| ගෙවිය යුතු ගිණුම්වල වැඩිවීම් | | 17,263,506.37 | 5,585,663.71 |
| කෙටිකාලීන වෙන්කිරීම් වැඩිවීම් | | (192,761.00) | 87,642.00 |
| තොග වැඩිවීම | | 174,444.12 | (282,038.71) |
| ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම් | | (3,216,462.78) | (3,700,587.27) |
| පුර්ව ගෙවුම් වැඩිවීම් | | (2,077,913.33) | 5,518.94 |
| රඳවාගත් ඉපැයීම්වල වැඩිවීම්/(අඩුවීම්) | | - | (6,048,434.99) |
| පාරිතෝෂික දායකය | | 1,577,313.04 | 3,616,239.21 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **55,209,139.99** | **8,393,639.45** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | | (33,534,830.07) | (10,297,005.48) |
| කල්බදු ඉඩම් මිලදී ගැනීම් | | (18,317,757.08) | - |
| දිගුකාලීන ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම් | | 31,909.30 | (37,256.71) |
| ආයෝජන ප්‍රතිලාභ | | 4,469,934.05 | 8,476,056.02 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(47,350,743.80)** | **(1,858,206.17)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| පාරිතෝෂික ගෙවීම | | (73,425.00) | - |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | | 10,563,557.85 | 9,186,000.00 |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **10,490,132.85** | **9,186,000.00** |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම් | | 18,348,529.03 | 15,721,433.28 |
| ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ | | 23,697,526.73 | 7,976,093.45 |
| වර්ෂය අග මුදල් සහ මුදල්වලට සමාන දෑ | 13 | **42,046,055.76** | **23,697,526.73** |

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

( රුපියල් වලින් )

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 141,356,976.54 | 2,153,119.00 | 13,000,000.00 | (29,078,694.04) | 127,431,401.50 |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම | - | - | | (6,418,707.79) | (6,418,707.79) |
| 2015 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය | 141,356,976.54 | 2,153,119.00 | 13,000,000.00 | (35,497,401.83) | 121,012,693.71 |
| විස්තීර්ණ ආදායම | | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | 11,606,497.00 | 11,606,497.00 |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම | 9,186,000.00 | - | - | - | 9,186,000.00 |
| 2015 දෙසැම්බර්31 දිනට ශේෂය | 150,542,976.54 | 2,153,119.00 | 13,000,000.00 | (23,890,904.83) | 141,805,190.71 |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම | - | - | - | - | - |
| 2016 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය | 150,542,976.54 | 2,153,119.00 | 13,000,000.00 | (23,890,904.83) | 141,805,190.71 |
| විස්තීර්ණ ආදායම | | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | 31,382,422.16 | 31,382,422.16 |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම | 10,563,557.85 | - | - | - | 10,563,557.85 |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 161,106,534.39 | 2,153,119.00 | 13,000,000.00 | 7,491,517.33 | 183,751,170.72 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } විව්වයි/සී/එන්සීපීඒ/ 2016/01/04 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2018 පෙබරවාරි 14 දින. |

සභාපතිනි

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 22(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිනිය වෙත 2017 සැප්තැම්බර් මස 22 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 29,401,177 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) යුනිසෙෆ් ප්‍රදාන ලෙස ලැබුණු රු. 8,400,544 ක් වටිනා වත්කම්වල අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යැමක් ලෙස දක්වා තිබුණි.

3

(ii) 2016 වර්ෂය තුළදී සත්‍ය වශයෙන්ම ලැබුණු මූල්‍ය ප්‍රදානයන්ගේ වටිනාකම රු. 4,167,000 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය රු. 10,563,558 ක් ලෙස දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජංගම නොවන වත්කම් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් අධිකාරිය වෙත ලබාදුන් රාජ්‍ය ප්‍රාග්ධන 2016 දෙසැම්බර් 31 දිනට රු.161,106,534 ක් හා ඒ යටතේ මිලදී ගෙන තිබුණු පිරිවැය රු.181,809,545 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, රාජ්‍ය ප්‍රදාන ක්‍රමවත් පදනමක් ලෙස ලාභ හෝ අලාභ වශයෙන් හඳුනාගෙන ගිණුම් තැබීම සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

(ආ) යුනිසෙෆ් ප්‍රදාන ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු එකතුව රු.8,400,544 ක් වූ යතුරු පැදියක් හා පරිගණක හා උපාංග ක්‍රමානුකූල පදනමක් ලෙස ලාභ අලාභ ලෙස හඳුනාගැනීම වෙනුවට ඒ සඳහා ගණනය කරන ලද රු. 2,003,986 ක් වූ ක්ෂය, ක්ෂය ගිණුම්වලින් ඉවත් කර යුනිසෙෆ් ප්‍රදාන ගිණුමට හර කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ව්‍යාපෘති අරමුදල් 15 කට අදාළව දිගුකාලයක සිට පැවති ගිණුම් තැබීමේ දෝෂ හා ප්‍රදාන ලෙස ලැබුණු මුදලට වඩා වැඩි මුදලක් වියදම් දැරීම හේතුවෙන් ව්‍යාපෘති අරමුදල් 07 ක එකතුව රු. 1,757,931 ක හර ශේෂ ඇති වී තිබුණි. අරමුදල් 8 ක එකතුව රු.7,682,494 ක් වූ බැර ශේෂවලින් එම හර ශේෂ හිලව් කර රු.5,924,567 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

4

(ආ) පෙර වර්ෂයට අදාලව රු. 225,167 ක ක්ෂය සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගිණුමට ගැලපීම නිසා වර්ෂයට අදාල ක්ෂය වියදම හා අතිරික්තය එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිරවුල් නොකළ රු. 21,457,789 ක අත්තිකාරම් ලැබිය යුතු ශේෂයක් ලෙස ජංගම වත්කම් යටතේ දක්වා තිබිය දී අදාල වියදම් ගිණුම් ද හර කර උපචිත වියදම් ගිණුමට බැර කර තිබුණි. මේ හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ජංගම බැරකම් සහ වසරේ අතිරික්තය පිළිවෙලින් එම වටිනාකමින්ම අධි හා ඌන ගණනය වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ගෙවීම කර තිබුණු රු. 1,215,000 ක සුනාමි ප්‍රතිලාභීන්ට කළ ගෙවීම්, සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන්ම අඩු වී තිබුණි.

(ඉ) 2017 මාර්තු 18 දින ආරම්භ කර තිබූ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා 2016 දෙසැම්බර් 29 දිනැතිව චෙක්පතකින් කළ රු.7,040,000 ක් ඉදිරියට කළ ගෙවීම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වියදම රු. 2,040,164 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු. 1,334,852 ලෙස දැක්වීමෙන් වර්ෂයේ අතිරික්තය රු. 705,312 කින් අධිගණනය වී තිබුණි.

(උ) 2000 වර්ෂයේ දී කල්බදු ක්‍රමයට ලබා ගෙන තිබූ ඉඩමක් වෙනුවෙන් ගෙවා තිබූ රු.8,422,460 ක් වූ බදු මුදල් වාර්ෂිකව රු.168,449 බැගින් වසර 50 ක් තුළ ක්‍රමක්ෂය කළයුතු වුවද, පසුගිය වර්ෂ 16 තුළම එසේ ක්‍රමක්ෂය කර නොතිබුණි. එම වරද නිවැරදි කිරීම සඳහා පසුගිය වර්ෂ 16 ට සහ සමාලෝචිත වර්ෂයට අදාල මුළු ක්‍රමක්ෂය මුදල වූ රු. 2,863,636 ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු. 2,695,187 කින් ඌන ගණනය වී තිබුණි.

(ඍ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල්මය නොවන ගැලපීම් මෙහෙයුම් ලාභයට ගැලපීමේදී රු. 2,062,404 ක් වූ ක්ෂය හා රු. 242,460 ක් වූ පාරිතෝෂික වැඩියෙන් ගලපා තිබුණි.

(ඵ) 2016 දෙසැම්බර් 30 වන දින පොත් මුද්‍රණය කර ගැනීම වෙනුවෙන් ගෙවන ලද රු.148,295 ක මුදල අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වුවද, මෙම චෙක්පත 2017 මැයි 18 දින අවලංගු කර තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

ළමා ආරක්ෂක අධිකාරිය හා ළමා ආරක්ෂක අරමුදල අතර සිදුවන අන්තර් ගනුදෙනු නිසිපරිදි සටහන් නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අධිකාරියට අරමුදලින් ලැබිය යුතු ශේෂය රු.5,889,373 ක හා අධිකාරියෙන් අරමුදලට ගෙවිය යුතු ශේෂයේ රු.3,256,982 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල වගකීම් යටතේ දක්වා තිබූ එකතුව රු. 1,611,904 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) ළමා ආරක්ෂක අරමුදලින් ළමා ආරක්ෂක අධිකාරියට ගෙවිය යුතු මුදලින් රු. 6,034,511 ක් වර්ෂ 3 කට වඩා වැඩි කාලයක සිට ද, රු. 700,000 ක් වසර 2 කට පෙර සිට ද, අරමුදලින් අධිකාරියට ලැබිය යුතු ශේෂයෙන් රු. 6,882,200 ක් වර්ෂ 3 කට පෙර සිට ද, රු. 5,146,500 වසර 2 කට පෙර සිට ද, පැවත එන නමුත් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

6

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව ජංගම වත්කම් යටතේ දක්වා තිබූ එකතුව රු. 2,398,636 ක් වූ ශේෂ 07 ක් වර්ෂ 01 සිට වර්ෂ 04 ක කාලයක සිට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ඉදිරියට ගෙන එමින් පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති සහ රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(1),(3),(4) | සමාලෝචිත වර්ෂය තුළදී සිදු වූ වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | වාහන අනතුරු / හානි ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 137 (5), 215 | භාණ්ඩ/සේවා ඇනවුම් කොට ඒවා ලැබී ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් අනුමත කළයුතු වුවත්, අධිකාරියට ලැබී නොතිබූ එකතුව රු.4,920,464 ක් වූ භාණ්ඩ වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින චෙක්පත් 7 ක් ලියා තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 325 | සමාලෝචිත වර්ෂය තුළ මුද්දර වෙනුවෙන් රු.400,445 ක් වැය කර තිබූ අතර, ලබා ගන්නා මුද්දර සම්බන්ධයෙන් ලේඛනයක් හෝ අභ්‍යන්තර පාලන පිළිවෙතක් අනුගමනය කර නොතිබුණි. |

| | |
|---|---|
| (v) මුදල් රෙගුලාසි 371(අ) (සංශෝධිත)2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 21,457,789 ක නිරවුල් නොකළ අත්තිකාරම් පැවති අතර, ඉන් රු. 360,682 ක් පසුගිය වර්ෂ දෙකකට පෙර සිට පැවත එන නොපියවූ අත්තිකාරම් විය. |
| (vi) මුදල් රෙගුලාසි 751(1) (3) (4) | සමාලෝචිත වර්ෂයේ දී රු. 2,256,750 ක් වැය කර අත් පත්‍රිකා/ස්ටිකර් පොත් මුද්‍රණය කර තිබුණ ද, එම මුද්‍රිත ලැබීම් නිකුත් කිරීම වෙනුවෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2004 මැයි 12 දිනැති අංක 4/0427/020/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | විද්‍යුත්/මුද්‍රිත මාධ්‍ය සඳහා නිකුත් කරනු ලබන දැන්වීම් රාජ්‍ය මාධ්‍ය ආයතන මඟින් ඉටු කරවා ගත යුතු වුවද, අධිකාරිය විසින් රු. 191,025 ක් ගෙවා පෞද්ගලික ආයතන ලවා පුවත්පත් දැන්වීම් පළකර ගෙන තිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන අනුව රු.39,401,325 ක් වටිනා පරිගණක උපාංග හා මෘදුකාංග අධිකාරිය සතු වුවද, ඒ සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

විධිමත් අනුමැතියකින් තොරව, වාර්ෂිකව පුනරාවර්තන වියදම් දැරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා මුදලින් සේවකයන් විශ්‍රාම යාමේදී ගෙවිය යුතු පාරිතෝෂික වියදම් දැරීම සඳහා වසර ගණනාවක සිට ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.877,237 ක් තැන්පත් කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු. 6,259,704 ක් විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 29,701,311 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,011,985 ක් වීමෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 30,713,296 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ජාතික සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබුණු ප්‍රතිපාදන රු. 108,812,159 කින් වැඩි වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී අධිකාරියේ 2014 හා 2016 වර්ෂවල දී පිළිවෙලින් රු. 3,631,016 ක හා රු. 29,701,301 ක අතිරික්තයන් ද, 2012, 2013 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු. 12,058,337, රු. 1,302,856 හා රු. 1,011,985 වශයෙන් ඌනතාවයන් ද නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු. 36,258,920 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු. 251,336,754 දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

අධිකාරියේ සේවය කළ ගණකාධිකාරිණිය 2010 අගෝස්තු 25 දින සිට වැඩ තහනමට ලක්කර තිබූ අතර, ඇයට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතට අනුව, ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාර වලට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමත්, එය ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා පරිපාලන සංශෝධනයන් නිර්දේශ කිරීමත්, ළමා අපචාර වැළැක්වීමේ කාර්ය සඳහාත් එවැනි

9

අපචාර වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමත්, දැනුවත් කිරීමත්, නීති ක්‍රියාත්මක කිරීම් නියාමනය කිරීමත් විමර්ශන හා අපරාධ නඩු කටයුතු පිළිබඳ ප්‍රගතිය නියාමනය කිරීමත්, අධිකාරියේ ප්‍රධාන කර්තව්‍ය වේ. මේ සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා වර්ෂ 19 ක් ගත වී ඇතත්, ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය නීතිගත කිරීමට සමාලෝචිත වර්ෂයේ දී ද ක්‍රියාකර නොතිබුණි.

(ආ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සේව් ද චිල්ඩ්‍රන්ස් (save the children) ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂය සඳහා වෙන් කර තිබූ රු. 23,000,000 න් රු. 10,000,000 ක් ළමා රක්ෂක අධිකාරිය වෙත 2016 අගෝස්තු 24 දින ලබා දී තිබුණි. ඉන් අපේක්ෂිත කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී වියදම් කර තිබූ මුදල රු. 7,969,133.80 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකර රු. 2,030,866 ක් නැවත අමාත්‍යාංශය වෙත යවා තිබුණි.

(ඇ) ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකත්ව මණ්ඩලය සමඟ එක්ව ළමා සුරැකුම් පාඨමාලාවක් සමාලෝචිත වර්ෂය තුළදී පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද එම පාඨමාලා ආරම්භ කර නොතිබියදී එම ආයතන 02 ක සඳහා 2016 දෙසැම්බර් 31 දින රු. 10,333,000 ක් ගෙවා තිබුණි.

(ඈ) අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමේ ප්‍රගතිය

(i) 2016 වර්ෂය තුළ අධිකාරිය වෙත පැමිණිලි 9,540 ක් ලැබී තිබුණ ද, ඉන් විසඳා තිබුණේ පැමිණිලි 2,845 ක් පමණි. ලැබී තිබූ පැමිණිලිවලින් සියයට 70 ක් පමණ විසඳා අවසන් කර නොතිබූ අතර, එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවරයන් හා ඒවායේ වර්තමාන තත්ත්වය පැහැදිලිව හඳුනාගත හැකි පරිදි තොරතුරු පවත්වාගෙන නොතිබුණි.

10

(ii) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දී ලැබී තිබූ පැමිණිලි 48,417 කින් සමාලෝචිත වර්ෂය වන විට, නොවිසඳී ඉදිරියට ගෙන ගොස් තිබූ පැමිණිලි සංඛ්‍යාව 24,833 ක් විය. එය මුළු පැමිණිලි ප්‍රමාණයෙන් සියයට 51 ක් විය.

(iii) අධිකාරිය වෙත වසරක් පාසා ලැබෙන පැමිණිලිවලින් සීමිත ප්‍රමාණයක් පමණක් එම වර්ෂය තුළ විසඳීමත්, පැමිණිලිවලට සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය හා දිස්ත්‍රික් නිලධාරීන් විසින් වාර්තා නොකිරීම හා ඔවුන් වෙතින් සිදුකරනු ලබන තොරතුරු කැඳවීම් හා විමර්ෂණයන් පිළිබඳ පසුවිපරම් කිරීම් හා අධීක්ෂණයන් නිසි පරිදි සිදු නොකිරීම නිසා නොවිසඳී ඇති පැමිණිලි සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වී ඇතිබව නිරීක්‍ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ළමා අපචාර සම්බන්ධ විවාද තරඟාවලියක් පවත්වා තිබූ අතර, එහි අවසන් මහා තරඟය 2016 නොවැම්බර් 04 දින පවත්වා තිබුණි. ඊට සමගාමීව තේමා 4 ක් යටතේ අත්පත්‍රිකා 60,000 ක් මුද්‍රණය කර බෙදා හැරීමට සැලසුම් කර රු.244,000 ක් වැය කර එම අත්පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා භාරදී තිබුණ ද විවාදය පවත්වා මාස 2 ½ කට පසු එනම්, 2017 ජනවාරි 25 දින එම අත්පත්‍රිකා ආයතනය වෙත ලැබී තිබුණි.

(ආ) ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් තේමා 03 ක් යටතේ තත්පර 15 ක කාලයක් තුළ විකාශනය කිරීම සඳහා සිංහල හා දෙමළ භාෂාවෙන් දැන්වීම් 09 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් තෝරාගෙන රු. 3,974,471 ක් ගෙවා තිබුණි. ඉන් රු.1,108,651 ක් වැය කළ දැන්වීමෙන් "ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳ ළමයින්ම සැලකිලිමත් වීම" යන තේමාව යටතේ වූ දැන්වීමෙන් ප්‍රමාණවත් පණිවිඩයක් ලබා දී නොමැති බවත්, මාධ්‍ය හරහා විකාශනය කිරීමට ප්‍රථමයෙන් පාසල් මට්ටමින් හෝ ඇගයීමකට භාජනය කළ හැකිව තිබියදී එසේ නොකර රු. 17,622,874 ක් වැය කරමින් රූපවාහිනී, ගුවන්විදුලි මාධ්‍ය මඟින් එම දැන්වීම් විකාශනය කර තිබුණි.

(ඈ) ළමා ආරක්ෂාව සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ මාර්ගෝපදේශ අත්පොතක් සකස් කිරීමටත්, එම වැඩසටහන් නියාමනය කිරීම සඳහා උපදෙස් දීමට ක්‍රමවේදයක් සකස් කිරීමේ උපදේශන සඳහා පුද්ගලයන් දෙදෙනෙකු වෙත 2016 දෙසැම්බර් 31 දින පිළිවෙලින් රු. 698,689 ක් සහ රු.750,000 ක් ගෙවා තිබූ නමුත්, ගිවිස ගත් කාලය අවසන් වුවද එම වාර්තා ලබා ගෙන නොතිබුණි.

(ඈ) ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම හා ඊට අදාල සම්බන්ධීකරණය සඳහා උපදෙස් ලබා ගැනීමේ උපදේශන සේවාවක් රු. 303,000 ක් ගෙවා ලබා ගැනීමට සැලසුම් කළ ද, එම සේවාව ද ලබා ගෙන නොතිබුණි.

(ඉ) ළමා ආරක්ෂාව පිළිබඳ 2005 – 2015 ත් අතර වර්ෂවලදී සිදුකළ පර්යේෂණ පිළිබඳ විචාරාත්මක ග්‍රන්ථ නාමාවලියක් සකස් කිරීම සඳහා 2016 ජුලි 07 දින බාහිර පාර්ශවයකට රු. 385,200 ක අත්තිකාරම් මුදලක් දී තිබූ අතර, මාස 06 කට පසු එම මුදල නැවත අධිකාරිය වෙත ගෙවා තිබුණි. එම කාර්යය නැවත වෙනත් පාර්ශවයක් මඟින් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ දී මුද්‍රිත වාර්ෂික වාර්තා 85 ක් ද, ළමා ආරක්ෂාව හා පුනරුත්ථාපන සඳහා යෝජිත ප්‍රතිපත්ති පොත් 370 ක් ද, අත් පත්‍රිකා 36 ක් හා කැලැන්ඩර් 24 ක් ද, 2013 වර්ෂයේ දී රු. 144,480 ක් වැය කර මුද්‍රණය කළ අත්පත්‍රිකා 25,000 ක් ද, 2016 වර්ෂයේ දී රු. 131,100 ක් වැය කර මුද්‍රණය කළ ස්ටිකර් 35,000 ක් ද, 2017 මැයි 15 දින වන විටත් අපේක්ෂිත අරමුණ සඳහා බෙදා හැරීමකින් තොරව ගබඩාවේ නිශ්කාර්යව තිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා දිවා සුරැකුම් සේවා සැපයීම පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා පර්යේෂණයක් සිදු කිරීමට යෝජනා ලබා ගැනීම සඳහා රු. 267,371 ක් වැය කර 2016 අගෝස්තු 16 දින පුවත්පත් දැන්වීමක් පල කර තිබුණි. පසුව එම අදහස වෙනස් කරමින් අදාල තොරතුරු අමාත්‍යාංශයේ,

පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව හා අධිකාරියේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින නිලධාරීන් මඟින් ලබා ගැනීමට තීරණය කිරීම හේතුවෙන් මෙම පුවත්පත් දැන්වීම සඳහා වැය කළ වියදම අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ඇ) ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි වාර්තා කිරීමේ පද්ධති සමාලෝචනය කිරීම සඳහා උපදේශන ලබා ගැනීම වෙනුවෙන් බාහිර පාර්ශවයකට රු. 979,000 ක් ගෙවීම් කර තිබූ නමුත් එම උපදේශන වාර්තාවේ ඇතුළත් නිර්දේශ, සංකීර්ණ හා ප්‍රායෝගිකව සිදුකළ නොහැකි බව දක්වමින් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත කාර්ය මණ්ඩලය 527 ක් සහ තථ්‍ය කාර්ය මණ්ඩලය 389 ක් වීමෙන් තනතුරු 138 ක් පුරප්පාඩුව පැවැතුණි. ඉන් තනතුරු 108 ක් ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් වූ අතර, මෙම තනතුරේ දැනට සේවයේ නියුක්තව සිටින නිලධාරීන් 252 ගෙන් සිදු කෙරෙන කාර්යසාධනයන් පිළිබඳව ද නිසි අධීක්ෂණයන් සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ ප්‍රධාන තනතුරු 5 ක් පුරප්පාඩුව පැවතීම, එහි කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණයන් නිසි පරිදි සිදු නොවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. ආයතනයේ ගණකාධිකාරී හා මූල්‍ය කළමණාකරන තනතුරු පුරප්පාඩුව පැවතීම නිසා ආයතනයේ මූල්‍ය කළමනාකරණ කටයුතු ක්‍රමවත්ව සිදු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) ආයතනයේ කටයුතු සිදු කිරීම සඳහා අංශ 10 ක් පමණ පවතින නමුත් අනුමත කාර්යාල කාර්ය සහායකයින් සංඛ්‍යාව 03 ක් පමණක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009(1) හි 3 ඡේදයට අනුව අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අභ්‍යන්තර විගණන අංශවලට අනුයුක්ත නොකිරීම හේතුවෙන් අභ්‍යන්තර විගණනය සීමා කිරීමට සිදු වී තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | උපචිත වියදම්/ඉදිරියට කළ ගෙවීම් ගැලපීම්, ක්ෂය වෙන් කිරීම්, ජර්නල් සටහන් යෙදීම නිසි පරිදි සිදු කර නොතිබීම. |
| (ආ) අත්තිකාරම් | අත්තිකාරම ලබා දීම හා නිරවුල් කිරීම නිසි පාලනයකින් සිදු කර නොතිබීම. |

14

| | | |
|---|---|---|
| (ඇ) මෙහෙයුම් පාලනය | i | පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමේ ප්‍රමාදයන් හා පැවැත් වූ වැඩසටහන් පිළිබඳ ප්‍රගතීන්,පසුවිපරම් කටයුතු හා නිසි අධීක්ෂණයන් සිදුකර නොතිබීම. |
| | ii | නිසි සැලසුම් කිරීමකින් තොරව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සැලසුම් කල වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

15